# ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ජාගකොස)

# *වාර්ෂික වාර්තාව*

# *2018*


**ලිපිනය**

241, උද්‍යාන පාර,

කොළඹ 05.

**වෙබ් අඩවිය**

www.ntc.gov.lk

**විද්‍යුත් තැපැල**

info@ntc.gov.lk

**ක්ෂණික ඇමතුම්**

1955

NTC/PL/ Annual Report / 2018 2019.07.30

ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය,
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය,
7වන මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.

**<u>වාර්ෂික වාර්තාව - 2018</u>**

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) වගන්තිය හා රාජ්‍ය ව්‍යාපාර යහපාලනය සඳහා වූ උපදෙස් මාලාවේ අංක 05 හා 06 පරිච්ඡේද අනුව සකස් කරන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහාවූ කාර්ය සාධන වාර්තාව, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ඉතාමත් සතුටින් ඉදිරිපත් කරමි.

ජනක මල්ලිමාරච්චි,
සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

# පටුන


| පරිච්ඡේදය | පිටුව |
|---|---|
| කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය | 01 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 03 |
| දළ විශ්ලේෂණය | 05 |
| කොමිෂන් සභාවේ සංයුතිය | 06 |
| 2018 වර්ෂයේ කාර්යසාධනය | 07 |
| වාර්ෂික ගිණුම් | 31 |
| විගණකාධිපති වාර්තාව | 49 |

## කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය

## 2018 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා

| | | |
|---|---|---|
| 1. | ඉංජි.එම්.ඒ.පී.හේමචන්ද්‍ර මහතා | -සභාපති |
| 2. | ආනන්ද විජයරත්න මහතා | -සාමාජික (නිලබලයෙන්) |
| 3. | ඒ.එම්.ආර්.ජේ.කේ.ජයසිංහ මහතා | -සාමාජික (නිලබලයෙන්) |
| 4. | ඒ.එම්.අසංග දයාරත්න මහතා | -සාමාජික (නිලබලයෙන්) |
| 5. | මහාචාර්ය ජේ.එම්.එස්.ජේ.බණ්ඩාර මහතා | -සාමාජික |
| 6. | කථිකාචාර්ය දිමන්ත ද සිල්වා මහතා | -සාමාජික |
| 7. | වරලත් ඉංජි. එස්.පී.ඩබ්.ජයසිරිවර්ධන මහතා | -සාමාජික |
| 8. | නීතිඥ ධනුෂ්ක වැලිගම මහතා | -සාමාජික |

### මාණ්ඩලික රැස්වීම් හා විගණන හා කළමනාකරණ රැස්වීම්

2018 වර්ෂය තුළ පවත්වනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව 11 කි.

2018 වර්ෂය තුළදී පවත්වනු ලැබූ විගණන හා කළමනාකරණ රැස්වීම් සංඛ්‍යාව 03 කි.

# සභාපතිතුමාගේ පණිවුඩය



1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව 1994.04.04 දින ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිහිටුවා ඇති අතර එතැන් සිට මේ දක්වා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියාමන ආයතනයක් වශයෙන්, ශ්‍රී ලාංකික ජන සමාජය වෙත විශ්වාසදායී, කාර්යක්ෂම හා සුවපහසු බස් සේවාවක් උරුම කර දීමේ උදාර අභිලාශයෙන් විවිධ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2018 වර්ෂය තුළදී ද උක්ත අරමුණ සාක්ෂාත් කිරීම උදෙසා කාර්යභාරයන් රැසක් සිදු කර ඇත.

ඒ අතරින් විශේෂයෙන්ම සමාජ ශුභසාධනය පරමාර්ථ කොටගත් බස්රථ සේවා වශයෙන් ක්‍රියාත්මක 'සිසු සැරිය', 'ගැමි සැරිය' හා 'නිසි සැරිය' යන ව්‍යාපෘතීන් හා සමස්ථ බස් මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේම උන්නතිය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් ගණනාවකි. පාසල් දරුදැරියන්ගේ කායික මානසික පීඩාවන් දුරුකර කලට වේලාවට පාසලට යාමේ සහ ආරක්ෂාකාරීව ආපසු නිවෙස් බලා පැමිණීමේ පහසුකම් සැලසීම අරමුණු කරගෙන 'සිසු සැරිය' බස් රථ සේවා ව්‍යාපෘතියත්, ප්‍රවාහන පහසුකම් නොමැති දුෂ්කර ප්‍රදේශ වල වෙසෙන ජනතාවගේ දෛනික ගමනාගමන අවශ්‍යතාවන් ඉටුකරදීම අරමුණු කරගෙන 'ගැමි සැරිය' බස්රථ සේවා ව්‍යාපෘතියත්, රාත්‍රී කාලයේ සහ හිමිදිරි උදෑසන ප්‍රාදේශීය මාර්ගවල බස් සේවා සැපයීමේ ඌනතාවයට පිළියමක් වශයෙන් 'නිසි සැරිය' ව්‍යාපෘතියත් ක්‍රියාත්මක කෙරේ.

දිවයිනේ සමස්ථ මගී ජනතාව වෙත සුහදශීලී මෙන්ම විශ්වසනීය, ආරක්ෂාකාරී, පොදු ප්‍රවාහන සේවාවක් සහතික කිරීම සඳහා 2018 වර්ෂය තුළදී ද රියැදුරු හා කොන්දොස්තරවරුන් පුහුණු කිරීමත් බස් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සියළු පාර්ශවකරුවන් දැනුවත් කිරීමත්, නිසි පරිදි මහා මාර්ගය භාවිත කිරීම තුළින් අනතුරු අවම කර ගැනීම සම්බන්ධයෙන් පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීමත් සිදුකර ඇත. බස් සේවාවන් නියමිත වේලාවට සපයාදීම මගින් පොදු බස් මගී ප්‍රවාහන සේවයෙහි ගුණාත්මක භාවය ඉහළ නැංවීමට කටයුතු කර ඇති අතර ශ්‍රී ලංගම ඇතුළු සියලුම බස් ධාවකයින් වෙත සම අවස්ථා සැලසෙන පරිදි විද්‍යාත්මක, ඒකාබද්ධ චක්‍රීය කාලසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට වෙනත් වර්ෂ වලදී මෙන්ම මෙම වර්ෂයේදීද සැලකියයුතු උත්සාහයක් දරා ඇත.

ගමනාගමන කොමිෂන් සභාව බස් මගී ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීමේ ආයතනය වන හෙයින් මෙම වසරේ දැනට පවතින 2009 වර්ෂයේ සකස් කරඇති ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සම්බන්ධව **ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයත් සමග එක්වී** කාර්යයන් රැසක් ඉටුකර ඇති අතර නව ප්‍රවාහන ප්‍රතිපත්තියේ කෙටුම්පත් වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමටද කටයුතු කර ඇත. ඊට අමතරව දැනට පවතින 2002 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද බස් ගාස්තු ප්‍රතිපත්තිය වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම ද 2018 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය සමග එක්ව සාකච්ඡා පැවැත්වීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යයන් තවදුරටත් පහසු වෙන් කරගැනීම සහ මහජනයාට වඩාත් ගුණාත්මක, ආරක්ෂාකාරී සහ සුවපහසු ප්‍රවාහන සේවාවක් ලබාදීම සඳහා ආයතනික කටයුතු වඩාත් නීත්‍යානුකූලව සිදු කිරීම සඳහා 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අදාල කාර්යයන් ආරම්භ කිරීම මෙම වසරේ සිදු කර ඇත.

තවද වර්ෂයක් පාසා එළි දක්වනු ලබන ‘ප්‍රවාහන සංඛ්‍යා ලේඛන වාර්තාව’, ප්‍රවාහන ක්ෂේත්‍රය ආශ්‍රිත නව ප්‍රවණතා සොයා බැලීම, ප්‍රතිපත්ති සම්පාදනය, නව සැලසුම් සකස් කිරීම හා අධ්‍යයන කටයුතුවල නියැලෙන්නන්ගේ පහසුව පිණිස, ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාල සියලු දත්ත එක්තැන් කර 2017 වාර්තාව මෙම වර්ෂයේදී එළි දක්වන ලදී.

ශ්‍රී ලංකාව තුළ පොදු ප්‍රවාහන මාධ්‍යයන් අතුරින් වඩාත් ප්‍රචලිතව ඇති මාධ්‍ය වන බස් ප්‍රවාහනය ගුණාත්මක බවින් වර්ධනය කිරීම පිණිසත් ඒ කෙරෙහි ඇති ඉල්ලුම ක්‍රමක්‍රමයෙන් වැඩි කර පෞද්ගලික වාහන භාවිතය අවම කිරීමත් අරමුණු කර දිවයිනේ විවිධ ජනාකීර්ණ ප්‍රදේශවල නවීන පහසුකම් සහිතව බස්රථ නැවතුම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මකව පවතින අතර සාර්ථකව අවසන් කළ බස් නැවතුම්පොළ තුනක් 2018 ජනවාරි මස ජනතා අයිතියට පත් කර ඇත.

තවද පොදු ප්‍රවාහනය සඳහා ගෝලීය තත්ව පදනම් වූ (GPS) වාහන පිරික්සුම් ක්‍රමය තුළින් ක්ෂණිකව දුරස්ථව සිට බස් රථ නියාමනය කිරීමටත් මගී පැමිණිලි විමර්ශණය හා තොරතුරු සැපයීමටත් කටයුතු කර ඇත.

මේ අකාරයට ශ්‍රී ලාංකීය පොදු මගී ප්‍රවාහන බස් සේවාවේ ගුණාත්මක බව ආරක්ෂා කරගනිමින් මගී ජනතාවට විශ්වසනීය සේවාවක් සපයා දීමට ගන්නා උත්සාහයේදී ඒ සඳහා සහාය දක්වනු ලබන ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා හා ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයටත්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට මෙන්ම සමස්ථ බස් ධාවකයින්ට හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල වලටත්, සෑම අවස්ථාවකදීම සහාය දක්වනු ලබන ශ්‍රී ලංකා පොලීසියේ හා ප්‍රවාහනයට සම්බන්ධ සියළු දෙපාර්තමේන්තු, ආයතන වල සියළුම නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය ප්‍රකාශ කර සිටිමි.

**ජනක මල්ලිමාරච්චි**
**සභාපති,**
**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

# දළ විශ්ලේෂණය

## අපගේ දැක්ම...

***දිවයින තුළ සමාජ-ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා ගුණාත්මක, පිරිවැය ඵලදායී සහ ආරක්ෂාකාරී ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් හා සේවාවක් මගින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගේම විවිධ ගමනාගමන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සහතික වීම.***

## අපගේ මෙහෙවර...

***මගී ප්‍රවාහනයට අදාල ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් දීම සහ පොදුජන ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම බස් ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා අවශ්‍ය නියාමන රාමුවක් සකස් කිරීම.***

## අපගේ අරමුණු / පරමාර්ථ

- බස් සේවා සංවර්ධන කාර්යයන් ගුණාත්මකව මෙන්ම ප්‍රමාණාත්මකව ඉතා උසස් මට්ටමකින් අඛණ්ඩව පවත්වාගෙන යාම.
- කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් වර්ධනය කිරීම.
- තමන්ට වඩාත් සුදුසු බස් සේවයක් තෝරාගැනීමට මගීන්ට අවස්ථාව සැලසෙන ප්‍රවාහන පද්ධතියක් වර්ධනය කිරීම.
- මගී ප්‍රවාහන සේවාවන්හි නියැලි මෙහෙයුම්කරුවන්ගේ ස්ථාවරත්වය හා පැවැත්ම පිළිබඳව සහතික වීම.
- ග්‍රාමීය හා සංවර්ධනය වෙමින් පවත්නා ප්‍රදේශවල ක්‍රියාත්මක වන අඩු ප්‍රතිලාභ ලබන එහෙත් සමාජ අවශ්‍යතාවයන් අනුව අත්‍යවශ්‍ය වන බස් සේවාවන් සඳහා මූල්‍ය ආධාර ලබාදීම.
- මගී ප්‍රවාහන බස් සේවාවන් මගින් ඇතිවන පරිසර හානිය වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් සැලසුම්කොට වර්ධනය කිරීම.
- බස්රථවල ධාවන කාලයන් විධිමත් කිරීමෙන් බස්රථවල ඵලදායිතාවය වැඩිකිරීම.
- බස්රථ ධාවන කටයුතුවල ආරක්ෂාකාරී බව සහ විනයගරුක බව තහවුරු කිරීම.
- අන්තර් පළාත් සහ පළාත්බද යන අංශ දෙකෙහිම බස් ප්‍රවාහන ක්‍රම සම්බන්ධීකරණය කිරීම.
- රටේ සමස්ත ශ්‍රම ඵලදායිතාවය වැඩිදියුණු කිරීම.

# කොමිෂන් සභාවේ සංයුතිය

නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයින් පස් දෙනෙකුගෙන්ද කොමිෂන් සභාව සමන්විත වේ. කොමිෂන් සභාවේ සංවිධානාත්මක ව්‍යුහය සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම්, ධාවන හා සේවා අධීක්ෂණ, තත්ත්ව ආරක්ෂණ සහ බාහිර සම්බන්ධතා, මුදල් හා ප්‍රසම්පාදන යන දෙපාර්තමේන්තු 04 භාරව ක්‍රියාකරනු ලබන අධ්‍යක්ෂකවරුන් හතරදෙනෙකුගෙන් සමන්විත වේ.

2018 වර්ෂය අවසාන වනවිට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 204 ක් වූ අතර සේවයේ යෙදී සිටි ස්ථිර සේවක සංඛ්‍යාව 195 ක් විය.

**2018.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව**

| අනු අංකය | තනතුරු නාමය | සේවක කාණ්ඩය | අනුමත කාර්යමණ්ඩලය | දිනට සේවයේ යෙදී සිටි කාර්යමණ්ඩලය |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | HM 2 -1 | 01 | - |
| 02 | අධ්‍යක්ෂ | HM 1-1 | 04 | 04 |
| 03 | සහකාර අධ්‍යක්ෂ | MM 1-1 | 17 | 13 |
| 04 | කණිෂ්ඨ කළමනාකාර | JM 1-1 | 21 | 20 |
| 05 | කළමනාකරණ සහකාර | MA 4 | 36 | 37 |
| 06 | කළමනාකරණ සහකාර | MA 2-1 | 03 | 01 |
| 07 | කළමනාකරණ සහකාර | MA 1-1 | 76 | 74 |
| 08 | රියැදුරු | PL 3 | 13 | 15 |
| 09 | කාර්යාල කාර්ය සහායක | PL 1 | 12 | 11 |
| 10 | වේලා සටහන්කරු | PL 1 | 18 | 18 |
| 11 | කම්කරු | PL 1 | 03 | 02 |
| | **එකතුව** | | **204** | **195** |

මූලාශ්‍රය - පාලන දෙපාර්තමේන්තුව, ජාගකොස

# 2018 වර්ෂයේ කාර්යසාධනය

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ පොදු මගී ප්‍රවාහන බස් සේවාව 38.8%ක ආංශික දායකත්වයක් ලබාදෙමින් වඩාත් ජනප්‍රිය පොදු මගී ප්‍රවාහන සේවාව වශයෙන් විශාල මෙහෙවරක් ඉටු කරමින් පවතී. මෙම ආංශික දායකත්වය ක්‍රමයෙන් ක්ෂය වෙමින් පවතින පසුබිමක ජාතික ගමනාගමන කොමිෂන් සභාව නිරන්තරයෙන් මෙම ප්‍රවාහන ජාලයේ පවතින විවිධ ගැටළු සොයා බලා නිරාකරණය කරමින් මගී ජනතාව තුළ ඒ කෙරෙහි පවතින ප්‍රසාදජනක හැඟීම ඔප් නැංවීම සඳහා අප්‍රතිහත උත්සාහයක යෙදී සිටින ලදී.

ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම දැනට පවතින ආර්ථික, සමාජයීය හා පාරිසරික බොහෝ ගැටළුවලට ස්ථිරසාර විසඳුමක් සෙවීමේ ප්‍රයත්නයේදී ප්‍රවාහනය වෙත අති මහත් වගකීමක් පැවරෙන බව නොරහසකි. ශ්‍රී ලංකාවේද බොහෝ නගරවල උදෑසන හා සවස් කාලයේ මහා මාර්ග වල පවතින දැඩි රථවාහන තදබදය එක් අතකින් වැඩකරන අති බහුතරයක් ජනතාවගේ වටිනා කාලය විශාල වශයෙන් විනාශ කරන අතර දැඩි විඩාව නිසා ශරීර සෞඛ්‍ය පිරිහීමද සිදු වේ. ඊට අමතරව අනවශ්‍ය ලෙස සිදුවන ඉන්ධන දහනය නිසා පරිසරය උණුසුම් වීම හා වාහන දුම නිසා සිදුවන පරිසර දූෂණයද නොසලකා හැරිය නොහැකිය. දිනෙන් දින උග්‍ර වෙමින් පවතින මෙම ගැටළුව සඳහා වඩාත් කාලෝචිත විසඳුම වන්නේ පොදු මගී ප්‍රවාහන බස් සේවාවම තත්ත්වයෙන් උසස් විශ්වසනීය, කාර්යක්ෂම හා සුවපහසු සේවාවක් ලෙස නගා සිටුවීමත් පුද්ගලික වාහන භාවිතය හැකි පමණ අවම කිරීමත්ය.

මේ අනුව ශ්‍රී ලංකාව තුළ පොදු මගී ප්‍රවාහන සේවාව නියාමනය කිරීමේ ජාතික ආයතනය ලෙස ජාතික ගමනාගමන කොමිෂන් සභාව තම කාර්යභාරය නිසි ලෙස අවබෝධ කරගෙන එහි අභිවෘද්ධිය වෙනුවෙන් ව්‍යාපෘති ගණනාවක් දියත් කරන ලදී.

## 1. සමාජයීය ශුභසාධනය ප්‍රමුඛ කොටගත් බස් සේවා සැපයීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සමාජයීය ශුභ සාධනය පරමාර්ථ කොට ගත් බස්රථ සේවා වශයෙන් පාසල් සිසුන් සඳහාම වෙන්වූ 'සිසු සැරිය' බස් සේවාවත්, වෙනත් කිසිදු ප්‍රවාහන මාධ්‍යයක් ක්‍රියාත්මක නොවන දුෂ්කර මාර්ග සඳහා'ගැමි සැරිය' බස් සේවාවත්, ප්‍රාදේශීය මාර්ගයන්හි රාත්‍රි අවසන් ගමන් වාරය හා උදෑසන ප්‍රථම ගමන්වාරය ධාවනය කෙරෙන 'නිසි සැරිය' සේවාවත් යන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කෙරේ.

## 1.1 පාසල් බස්රථ සේවා ව්‍යාපෘතිය 'සිසු සැරිය'




'සිසුසැරිය' බස්රථ සේවාව


සිසුසැරිය පාසල් බස්රථ සේවා ව්‍යාපෘතිය, පාසල් සිසුන්ට කලට වේලාවට පාසලට ගොස් අධ්‍යාපන කටයුතු වෙහෙසකින් තොරව සිදු කරගෙන ආරක්ෂාකාරීව ආපසු නිවසට පැමිණීමේ පහසුකම් සැලසීම මුඛ්‍ය පරමාර්ථය කොටගත් ඉතාමත් කාලෝචිත, සාර්ථක ව්‍යාපෘතියකි. 2005 වසරේ ආරම්භ කර මේ දක්වා නොකඩවා ක්‍රියාත්මක කෙරෙන, ළමා හිංසනය අවම කර දෙමාපියන්ට ආර්ථික වශයෙන් සහනදායී ගාස්තු ක්‍රමයක් ලබාදීම මගින් විශ්වාසවන්ත සහ විධිමත් පාසල් ප්‍රවාහන සේවාවක් ලබාදීම මගින් සමාජ මෙහෙවරක් සිදු කිරීම මෙම ව්‍යාපෘතියේ අනෙකුත් පරමාර්ථ වේ.

මීට අමතරව ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රධාන නගර ආශ්‍රිත ජනප්‍රිය පාසල් වෙත සංක්‍රමණය වන ශිෂ්‍ය ප්‍රජාව වාර්ෂිකව ශීඝ්‍රයෙන් වැඩිවන ප්‍රවණතාවක් හමුවේ මහා මාර්ගයට එකතුවන පාසල් වෑන්රථ ප්‍රමාණයද ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් උදෑසන හා දහවල් කාලයේ නගර ආශ්‍රිතව උද්ගත වන රථවාහන තදබදයට පිළියමක් වශයෙන්ද ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මෙම බස් රථ සේවා ව්‍යාපෘතිය හඳුන්වා දී ඇත. එහිදි 'සිසු සැරිය' ව්‍යාපෘතිය සඳහා අවම වශයෙන් ආසන 42ක් සහිත බස්රථ යෙදවීම අනිවාර්ය වන අතර කුඩා වෑන්රථ කිහිපයක් වෙනුවට එසේ වැඩි ආසන සංඛ්‍යාවක් සහිත විශාල බස් රථ යෙදවීම මගින් උක්ත අරමුණ පහසුවෙන් සාක්ෂාත් කරගත හැකි වේ. මෙම සේවාවේදී සාමාන්‍ය බස් ගාස්තුවෙන් 50%ක් පමණක් සිසුන්ගෙන් අයකරනු ලබන අතර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ සහ පෞද්ගලික අංශයට අයත් බස්රථ යොදවා ගනු ලැබේ. මෙහිදී ධාවකයාට අහිමි වන ආදායම වෙනුවෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් කලින් ගිවිසගත් ගාස්තු ක්‍රමයක් අනුව පසුව ප්‍රතිපූරණය කරමින් සේවාවන් පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවට මහා භාණ්ඩාගාරය මගින් මුදල් වෙන් කරනු ලැබේ. 2018.12.31 වන විට 'සිසු සැරිය' ව්‍යාපෘතිය යටතේ යොදවා ඇති බස්රථ 1418

වන අතර (ආසන 15 පමණ වන) පාසල් වෑන් රථ 6000කට ආසන්න ප්‍රමාණයක් දිනකට නගරය වෙත පැමිණීම වලක්වා ඇති අතර පාසල් දරුවන් 90,000කට අධික සංඛ්‍යාවක් දිනකට සේවාව ලබාගනියි. 2018 වර්ෂය තුළ නව සිසු සැරිය සේවා 56ක් ආරම්භ කළ අතර මේ වන විට දිවයින පුරා ක්‍රියාත්මක 'සිසු සැරිය' සේවා සංඛ්‍යාව පළාත් අනුව පහත වගුවෙහි දැක්වේ.

| පළාත | 'සිසු සැරිය' බස් සේවා සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 431 |
| වයඹ | 286 |
| උතුරු මැද | 155 |
| දකුණ | 118 |
| සබරගමුව | 127 |
| ඌව | 92 |
| නැගෙනහිර | 115 |
| මධ්‍යම | 51 |
| උතුර | 36 |
| අන්තර් පළාත් | 07 |
| **එකතුව** | 1418 |

මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස




සිසුසැරිය සේවා නොකඩවා පවත්වාගෙන යම සඳහා ගිවිසුම්ගතව සිටින සියළුම සේවා සපයන්නන් විසින් අදාල කර්තව්‍ය නිසිලෙස ඉටු කරන්නේද යන්න ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ

නිලධාරීන් විසින් නිරන්තර පරීක්ෂාවට ලක් කරනු ලබන අතර සිසුන්ගේ හා දෙමාපියන්ගේ පැමිණිලි සම්බන්ධයෙන්ද ක්‍රියාමාර්ග ගනු ලැබේ. ගිවිසුම් කොන්දේසි කඩකිරීම, නොදන්වා සේවයෙන් ඉවත් වීම ආදී හේතු නිසා බස්රථ සේවා 27ක් 2018 වර්ෂය තුළදී අවලංගු කර ඇත.

2018 වර්ෂයේදී සිසුසැරිය සේවා සැපයීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 552.16ක ප්‍රතිපාදන වෙන් කරනලද අතර එයින් රුපියල් මිලියන 491.28 ක් සේවා සැපයුම්කරුවන් වෙත ගෙවා ඇත.

**1.2 ග්‍රාමීය බස්රථ සේවා ව්‍යාපෘතිය - 'ගැමි සැරිය'**



'ගැමිසැරිය' ග්‍රාමීය බස් සේවය

'ගැමිසැරිය' යනු, පොදු මගී ප්‍රවාහන සේවා ක්‍රියාත්මක නොවන මාර්ග සඳහා පමණක් හඳුන්වා දෙනු ලබන නගරයෙන් දුරස්ථ, ගම්බදව ජීවත් වන ජනතාව වෙත ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහාම 2005 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි. වර්තමානය වන විට 'ප්‍රවාහනය' යන්න සමාජයේ සෑම කටයුත්තකදීම පෙරටුවට පැමිණෙන මූලික අවශ්‍යතාවයක් බවට පත් වී ඇති අතර නිෂ්පාදන ක්ෂේත්‍රයේ මෙන්ම අනෙකුත් රැකී රක්ෂා කටයුතු සඳහාද අත්‍යවශ්‍ය අංගයක් වී තිබේ.


ව්‍යාපෘතිය සඳහා නව මාර්ග ඒ ඒ පළාත්වල මාර්ගස්ථ මගී මගී ප්‍රවාහන අධිකාරි මගින් යෝජනා කිරීමෙන් පසු ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මගී ඉල්ලුම සම්බන්ධයෙන් සහ සාමාජීය වශයෙන් එම ආයතන වෙත ලබා දීමේ වැදගත්කම සම්බන්ධව සමීක්ෂණ සිදු කර එම ප්‍රවාහන සේවාව සැපයීම මගින් සාමාජික, ආර්ථික ප්‍රශස්ථ මගී ඉල්ලුමක් ඇති බවට තහවුරු වුවහොත් අදාල ප්‍රවාහන අධිකාරී සමග එක්ව විවෘත ටෙන්ඩර් පරිපාටියක් ඔස්සේ ධාවකයන් තෝරාගනු ලැබේ. තවද මෙම බස්රථ අඛන්ඩව ධාවනය කිරීම සම්බන්ධයෙන් GPS තාක්ෂණය මගින් සැපයීම කරන අතර එම GPS අනුව ධාවනය කළා යයි තහවුරු කර ගන්නා ගමන් වාර සඳහා කි.මී.1කට ගිවිසගත් මුදල (රු.38)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සහනාධාර වශයෙන් ගෙවනු ලැබේ. 'ගැමිසැරිය' ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික අංශයේ ධාවකයන් පමණක් යොදා ගැනෙන අතර ආරම්භ කර ස්ථාවර ආදායමක් තහවුරු වන තුරු වසර 03ක් දක්වා ධාවකයාට සහනාධාර ගෙවනු ලැබේ. 2018.12.31 වන විට හඳුන්වා දෙන ලද මුළු 'ගැමිසැරිය' සේවා සංඛ්‍යාව 55ක් වන අතර නව සේවා ආරම්භ කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව නිරන්තර උත්සාහයක යෙදී සිටී.

2018 වර්ෂය සඳහා නව ගැමි සැරිය සේවා 6ක් ආරම්භ කිරීම සඳහා මූලික කටයුතු අවසන් කර තිබුණද ක්‍රියාත්මක කළ හැකි වූයේ සේවා 3ක් පමණි. 2018 අවසන් වන විට සහනාධාරය ලබමින් පවතින 'ගැමිසැරිය' සේවා සංඛ්‍යාව පහත වගුවෙහි දැක්වේ. පළාත් ප්‍රවාහන අධිකරී මගින් ගැමි සැරිය සේවාව සඳහා මාර්ග නිර්දේශ නොකිරීම මෙම සේවාවේ ඉලක්ක කරා යාමට ප්‍රධාන බාධාවක් වූ අතර ඒ සඳහා දැනුවත් කිරීම 2018 වර්ෂය තුළදී සිදු කරන ලද බස් ධාවකයින් දැනුවත් කිරීමේ ව්‍යාපෘති වලදී සිදු කරන ලදි.

| පළාත | 'ගැමිසැරිය' බස් සේවා සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | 02 |
| නැගෙනහිර | 02 |
| වයඹ | 04 |
| **එකතුව** | **08** |

මූලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස




2018 වර්ෂය තුළදී 'ගැමිසැරිය' සේවාව සැපයීම වෙනුවෙන් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් වෙන් තරන ලද මුදල රු. මිලියන 8.8 ක් වූ අතර සහනාධාර වෙනුවෙන් දරණ ලද වියදම රුපියල් මිලියන 2.74 කි.

### 1.3 රාත්‍රී බස් සේවා ව්‍යාපෘතිය - "නිසි සැරිය"

ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල රැකියා සහ අධ්‍යයන කටයුතු සඳහා කලට වේලාවට අදාල ස්ථාන කරා යා නොහැකි වීම නිසා එම ජනතාවට මහත් දුෂ්කරතා වලට මුහුණදීමට සිදුවී ඇත. ප්‍රධාන මාර්ග හැරුණුවිට සෙසු මාර්ග බොහොමයක රාත්‍රි කාලයේ සහ අලුයම් කාලයේ බස් සේවා අඛණ්ඩව ක්‍රියාත්මක නොවීමෙන් මෙම කණගාටුදායක තත්ත්වය උදා වී තිබේ. අළුයම හා රාත්‍රි ගමන්වාර වලදී බස්රථය ධාවනය තුළින් ප්‍රමාණවත් ආදායමක් නොලැබීම මෙසේ ධාවකයන් අදාල ගමන්වාර ධාවනය නොකිරීමට හේතු වී ඇත. මෙම ගැටළුවට පිළියමක් වශයෙන් ගමනාගමන කොමිෂන් සභාව විසින් 2005 වසරේදී 'නිසි සැරිය' බස් සේවා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.




'නිසි සැරිය' රාත්‍රී බස් සේවාව

අවසන් ගමන් වාරය සහ පසුදින අලුයම ප්‍රථම ගමන් වාරය සඳහා පොදු බස් සේවා යොදවා මගීන්ගේ ගමනාගමන අවශ්‍යතාවය සපුරා දීම ව්‍යාපෘතියේ මූලික අපේක්ෂාව වන අතර  එතෙක් කුලීරථ මගින් තම ගමන් පහසුව සලසා ගත් හා තාවකාලික නවාතැන්වල රැඳී සිට තම කටයුතු ඉටු කරගත් ජනතාවට මෙම සේවාව ලැබිම මහත් අස්වැසිල්ලක් වන අතර වඩාත් විශ්වාසදායී සේවාවක් ලෙස ස්ථාපිත කිරීම සඳහාත් අධීක්ෂණ කටයුතු පහසු කර ගැනීම සඳහාත් ශ්‍රී ලංකා ගමනාගමන මන්ඩලයට අයත් බස්රථ පමණක් යොදා ගැනේ. අධිවේගී මාර්ගයේ රාත්‍රී සේවා වලට සහ රාත්‍රියේ ධාවනය වන දුම්රිය සේවාවට සමගාමීව මෙම රාත්‍රී බස්රථ සේවා  බොහොමයක් ක්‍රියාත්මක වේ. 2018 වර්ෂය තුළදී නව 'නිසිසැරිය' සේවා 43ක් ආරම්භ කළ අතර 2018.12.31 වන විට ක්‍රියාත්මක 'නිසිසැරිය' සේවා සංඛ්‍යාව පහත පරිදි වේ.

| පළාත | 'නිසි සැරිය' බස් සේවා සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 62 |
| දකුණ | 33 |
| උතුර | 05 |
| වයඹ | 20 |
| උතුරු මැද | 11 |
| සබරගමුව | 03 |
| ඌව | 09 |
| නැගෙනහිර | 03 |
| මධ්‍යම | 27 |
| **එකතුව** | **173** |

මුලාශ්‍රය - සැලසුම් දෙපාර්තමේන්තුව, ජාගකොස




2018 වර්ෂය තුළදී 'නිසි සැරිය' බස් සේවාව වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 21.027ක් වෙන්කර තිබූ අතර දරණ ලද පිරිවැය රුපියල් මිලියන 12.02 කි.

මෙම සේවා ක්‍රියාත්මක කරවීමේදී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ජංගම පරීක්ෂණ අංශයේ නිලධාරීන් යොදවා නිරන්තර අධීක්ෂණයට ලක්කරන අතර සියළුම සේවා 100%ක් ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය විදිවිධාන සලසනු ලබයි. එමෙන්ම යම්යම් අවස්ථා වලදී සේවා සපයන්නන් කෙරෙහි මතුවන ප්‍රශ්න හා ගැටළු ඒ ඒ අවස්ථාවේදීම විසඳා දෙමින් සියළුදෙනාගේ අප්‍රතිහත කැපවීමෙන් විශිෂ්ඨ සේවාවක් ඉටු කරනු ලබයි.

ඉදිරි කාලයේදී මෙම සේවාවන් තවදුරටත් පුළුල් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව, දැඩි උත්සාහයක යෙදී සිටින නමුත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හා සමහර පළාත් මාර්ගස්ථ මගී

ප්‍රවාහන අධිකාරීවල නිලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය සතුටුදායක මට්ටමක නොතිබීම මේ සඳහා ඇති මහත් අභියෝගයකි.

## 2. බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම




පුහුණුවට සහභාගි වී සිටි බස් සේවක පිරිසක්

අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවය භාවිතා කරනු ලබන මගීන්ට වඩාත් කාර්යක්ෂම, ඵලදායි සහ තත්ත්වයෙන් උසස් සේවාවක් ලබා දීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා 2006 වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩව රියැදුරු කොන්දොස්තර පුහුණු වැඩසටහන් පවත්වාගෙන එනු ලබයි.


2018 වර්ෂය තුලදී නව කොන්දොස්තර මහත්වරුන් 598ක් පුහුණුව සඳහා කැඳවා ඇති අතර ඉන් 350ක් ද, රියැදුරු මහත්වරුන් 807ක් පුහුණුව සඳහා කැඳවා ඇති අතර ඉන් 620ක් ද,අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙහි පුහුණු වී හැඳුණුම්පත් ලබා ඇත.

සමාලෝචිත වර්ෂය තුළ පුහුණු වැඩ සටහන් 50ක් පැවැත්වීමේ ඉලක්කයක් ලබාදී තිබූ නමුත්, මුදල් ප්‍රතිපාදන නොමැති වූ නිසා පුහුණු වැඩ සටහන් 46 ක් පමණක් පවත්වන ලදි.මෙමඟින් නව රියැදුරු මහතුන් 620ක් හා නව කොන්දොස්තර මහතුන් 350 දෙනෙකු පුහුණු කර ඇති අතර, 274 දෙනෙකුහට නැවත පුහුණුව ලබාදී ඇත. තවද, රියැදුරු කොන්දොස්තර මහත්වරුන් 1832 දෙනෙකුට යාවත්කාලීන කිරීමේ පුහුණුව ලබාදී හැඳුනුම්පත් යාවත්කාලීන කර ඇත.

රියැදුරු බලපත්‍රලාභීන් වෙත නොමිලයේ ලබාදෙන PT පුහුණුව සඳහා 497දෙනෙකු කැඳවා ඇති අතර පුහුණු වැඩ සටහන් 05ක් පවත්වා 216 දෙනෙකු වෙත පුහුණුව ලබාදී ඇත.

| මාසය | 2018 වර්ෂය තුළ පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | නවක | | යාවත්කාලීන | | නැවත පුහුණු | | PT | |
| | රියැදුරු | කොන්දොස්තර | රියැදුරු | කොන්දොස්තර | රියැදුරු | කොන්දොස්තර | රියැදුරු | |
| ජනවාරි | 78 | - | 109 | 90 | - | - | 38 | 315 |
| පෙබරවාරි | - | 35 | 50 | 83 | - | - | 57 | 225 |
| මාර්තු | - | - | 125 | 102 | 13 | 45 | - | 285 |
| අප්‍රේල් | 72 | 27 | - | - | - | - | - | 99 |
| මැයි | 78 | - | 91 | 100 | - | - | 48 | 317 |
| ජුනි | - | 35 | 115 | 171 | - | - | - | 321 |
| ජූලි | 126 | 39 | 71 | 75 | 22 | 63 | - | 396 |
| අගෝස්තු | - | 80 | 88 | 110 | - | - | 37 | 315 |
| සැප්තැම්බර් | 80 | 22 | 84 | 85 | 37 | 33 | - | 341 |
| ඔක්තෝම්බර් | 93 | 51 | 48 | 51 | 15 | 46 | 36 | 340 |
| නොවැම්බර් | 93 | 61 | 85 | 99 | - | - | - | 338 |
| දෙසැම්බර් | - | - | - | - | - | - | - | - |
| **එකතුව** | **620** | **350** | **866** | **966** | **87** | **187** | **216** | **3292** |

නව රියැදුරු/කොන්දොස්තර පුහුණු පාඨමාලා - 2018




2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා වූ සමුච්චිත වියදම රු. මිලියන 4.83ක් විය.

## 3. පෞද්ගලික බස් සේවාව සඳහා ප්‍රතිසංස්කරණ

### 3.1 බස් නැවතුම්පල ඉදිකිරීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සම්පාදිත 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛණ වාර්තාව 2017' අනුව පොදු ප්‍රවාහන සේවාවෙහි ආංශික දායකත්වය වාර්ෂිකව ක්‍රමයෙන් පහළ යමින් යතුරු පැදි, කාර් අතුළු කුඩා පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යයන්හි එම අගය ඊට අනුරූපව ඉහළ යන ආකාරය මනාව

පෙන්නුම් කෙරෙන අතර පොදු ප්‍රවාහන සේවාවේ හා යටිතල පහසුකම්හි කිසියම් දුර්වලතා ඊට බලපා ඇති බව පෙනේ. එහෙයින් මගීන් ගමනාගමනයේදී සුවපහසුව හා කාර්යක්ෂම බව වඩාත් අපේක්ෂා කරන බව පැහැදිලි වන අතර බහුතර ජනතාව පොදු මගී ප්‍රවාහන සේවාව වෙත ආකර්ෂණය කරගැනීමේ අභියෝගය ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතුව ඇත. එබැවින් පොදුවේ මගීන් හා බස්රථ ධාවකයින්ගේ පහසුව පිණිස ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් බස් නැවතුම්පල ඉදිකිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ඒ අනුව 2015 වර්ෂයේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සකසන ලද සැලැස්මකට අනුව හා එහි පූර්ණ අධීක්ෂණය යටතේ කින්නියා නගරයේ ඉදිකරන ලද නව බස් නැවතුම්පල, 2017 වර්ෂය අවසානය වන විට සියළු වැඩ නිමවා 2018ජූලි මස 22 දින ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා අතින් ජනතා අයිතියට පත් කරන ලදී.





කින්නියා නව බස්නැවතුම්පල

මීට අමතරව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්මාණයක් ලෙස ඉදි කරන ලද හිඟුරක්ගොඩ හා මැදිරිගිරිය නව බස්නැවතුම්පල දෙකක් මගී ජනතාව හා ධාවකයින් සඳහා අවශ්‍ය සියළු පහසුකම් හා අංගෝපාංග සහිතව සියළු වැඩ අවසන් කර 2018.08.01 දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා ඇතුළු සම්භාවනීය පිරිසකගේ සහභාගිත්වයෙන් ජනතා අයිතියට පත් කරන ලදී. හිඟුරක්ගොඩ බස්නැවතුම්පල පරිපාලන කටයුතු සඳහා 2018.08.31දින අදාල ප්‍රාදේශීය සභාව වෙත භාරදෙන ලද අතර මැදිරිගිරිය බස්නැවතුම්පළ භාරදීම සඳහා කටයුතු කරමින් පැවතිනි.




හිඟුරක්ගොඩ නව බස් නැවතුම්පල




මැදිරිගිරිය නව බස් නැවතුම්පල

ඒ අනුව 2018 වර්ෂය තුළ නව බස් නැවතුම්පල තුනක් ජනතා අයිතියට පත් කර ඇත. මීට අමතරව කිළිනොච්චිය නගරයේ ඉදිකරමින් පැවති නව බස්නැවතුම්පල වැඩ 2018.12.31 දින වන විට 50%ක් පමණ වැඩ අවසන්කර ඇතත් කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය නිසා අතරමග නවතා ඇත. එහි ඉදිරි වැඩ කටයුතු සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇත.




ඉදි වෙමින් පවතින කිළිනොච්චිය නව බස් නැවතුම්පල

2018.12.31 දිනට බස් නැවතුම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 36.72 කි.

## 4. බස් ගාස්තු විෂමතා ඉවත් කිරීම

2002 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද බස් ගාස්තු ප්‍රතිපත්තියේ නිර්දේශයකට අනුව බස් ගාස්තු විෂමතා ඉවත් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

බස් මගියා ගමන් කරන දුරට සාපේක්ෂව ගාස්තුවක් අය කිරීමේ අරමුණින් හා ගාස්තු අවස්ථාවන් නිශ්චිත ප්‍රමිතියකට යටත්ව ස්ථාපනය කිරීමේ අරමුණින් බස් ගාස්තු ප්‍රතිපත්තිය මගින් ගාස්තු අවස්ථාවක් සඳහා වන සාමාන්‍ය දුර ප්‍රමාණයන් නිර්දේශ කරන ලදී . ඒ අනුව තැනිතලා මාර්ගයක ගාස්තු අවස්ථාවක සාමාන්‍ය දුර කි.මි. 2 ක් ලෙස හා කඳුකර මාර්ගයක ගාස්තු අවස්ථාවක සාමාන්‍ය දුර

කි.මී. 1.7 වන ලෙස ද දිවයිනේ සියලු බස් ධාවන මාර්ග මැනුම් කර ගාස්තු අවස්ථාවන් ස්ථාපනය කිරීමට නිර්දේශ කර ඇත. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර 2015 වර්ෂය අවසන් වන විට අන්තර් පළාත් මාර්ග 400ක, බස්නාහිර පළාතේ මාර්ග 780ක හා මධ්‍යම පළාතේ මාර්ග783ක, දකුණු පළාතේ මාර්ග 388ක, වයඹ පළාතේ මාර්ග 366ක ද ප්‍රමිතිගත ගාස්තු සබරගමුව පළාතේ මාර්ග 574 ක හා ඌව පළාතේ මාර්ග 480 ක මාර්ග මැනීම් කර ප්‍රමිතිගත ගාස්තු සකස් කර ඇත. 2018 වර්ෂයේදී සබරගමුව හා ඌව පළාත් දෙක තුළ බස් ගාස්තු විෂමතා ඉවත් කිරීමට ශ්‍රී ලංගම හා පළාත් ප්‍රවාහන අධිකාරී සමග සාකච්ඡා කරන ලදි.

**බස් ගාස්තු සංශෝධන සහ බස් ගාස්තු ප්‍රතිපත්තිය සංශෝධනය**

2001 වර්ෂයේ සකස් කර 2002 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන වර්තමානයේ ක්‍රියාත්මක බස් ගාස්තු ප්‍රතිපත්තිය අනුව සෑම වර්ෂයකම ජූලි 01 වන දින බස් ගාස්තු සංශෝධනය කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව 2018 වර්ෂයේ මැයි මස ඩීසල් මිල සැලකිය යුතු මිලකින් වැඩි වූ හෙයින් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සමඟ සහ බස් රථ හිමියන් සමග සාකච්ඡා කර 2018 ජූලි 01 දින සිදු කළ යුතු වාර්ෂික බස් ගාස්තු සංශෝධනය 2018 මැයි 23 වන දින සිදු කරන ලදි. ඒ අනුව පළමු ගාස්තු අවස්ථාව රු.12 වන ලෙස සහ අනෙකුත් ගාස්තු අවස්ථා 12.5%කින් වැඩි වන ලෙස කැබිනට් අනුමැතියක් අනුව බස් ගාස්තු සංශෝධනය කරන ලදි. ඉන් පසු 2018 වර්ෂයේ සිදු වූ ඩීසල් මිල ගණන් වෙනස් වීම මත තුන් වතාවක් අන්තර් වාර බස් ගාස්තු සංශෝධනය සිදු කළ අතර 2018/09/21 දින සිට 4%කින් බස් ගාස්තු වැඩි කිරීම 2018/11/09 දින සිට 2%කින් බස් ගාස්තු අඩු කිරීම සහ 2018/12/12 දින සිට 4.2%කින් බස් ගාස්තු අඩු කිරීම සිදු කළ අතර ඉහත අවස්ථා තුනේදීම පළමු ගාස්තු අවස්ථාව රු.12.00 ලෙස පවත්වා ගන්නා ලදි.

දැනට පවත්නා බස් ගාස්තු ප්‍රතිපත්තිය සකස් කිරීමට පාදක කර ගත් නිර්නායක වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම පිණිස 2017 වර්ෂයේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද විද්වත් කමිටුව 2018 වර්ෂය තුළදී කිහිප විටක් රැස්වී මෙම ගාස්තු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර 2018 වර්ෂය අග වන විට එම ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා මාර්ග සමීක්ෂණ දත්ත රැස් කිරීම සඳහා GPS සහිත පරිගණක වැඩසටහන සකස් කර ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේ කටයුතු සිදු කරමින් පැවතින. 2018 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 2.5 ක පිරිවැයක් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරා ඇත.

### 5. ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම.

2009.10.14 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති 2018 වර්ෂය වන විට ක්‍රියාත්මකව පැවති ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය වතමන් ආර්ථික, සාමාජීය අවශ්‍යතා හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව්‍යකරණ අවශ්‍යතා මත පදනම්ව යාවත්කාලීන කල යුතු බව පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුව විසින් කරන ලද නිර්දේශ හා මගපෙන්වීම පරිදි 2017 වර්ෂයේ ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත් කාලීන කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුව විසින් කෙටුම්පත් කරන ලද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති පරිවර්තනය කිරීම සහ එය සිංහල දෙමළ භාෂා වලට පරිවර්තනය කිරීම සහ එය මහජන අදහස් ලබා ගැනීම සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි පුවත්පත් වල පල කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් සිදු කරන ලදි. මහජන අදහස් ලබා ගැනීමෙන් පසුව සකස් කරන ලද ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කිරීම 2018 ජූනි මස සිදු කර ඇති අතර ඒ දක්වා සියළු කටයුතු ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සමග සම්බන්ධව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදි.

### 6. සීමිත නැවතුම් සංඥා පුවරු ව්‍යාපෘතිය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගී සේවා අවසර පත්‍ර යටතේ සහ පළාත් ප්‍රවාහන අධිකාරිවල මගී සේවා අවසර පත්‍ර යටතේ ධාවනය වන දුර ගමන් බස් රථ සේවාවල ගුණාත්මක බව වර්ධනය කිරීමේ අරමුණින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් දුර ගමන් සේවා බස්රථ සඳහා සීමිත නැවතුම් ස්ථාන හඳුන්වා දීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. 2018 වර්ෂය තුළදී මේ සම්බන්ධයෙන් මෝටර් රථ දෙපර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ ශ්‍රී ලංකා පොලීසිය සමග සාකච්ඡා කිහිපවරක් පැවැත්වූ අතර එම සාකච්ඡා වල ප්‍රතිඵලයක් වශයෙන් දුර ගමන් සේවා බස් රථ නැවැත්වීම සඳහා සීමිත නැවතුම් සංඥාව ගැසට් කිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලදි.

### 7. ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

1991අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව ප්‍රවාහන සේවාවේ ගුණාත්මක සහ ආරක්ෂාකාරී බව නියාමනය කිරීමේ බලතල ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඒ අනුව ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ පාර්ශවකරුවන් වන බස්රථ හිමිකරුවන්, පළාත් ප්‍රවාහන අධිකාරි සේවකයන් ඇතුළු ප්‍රවාහනය සම්බන්ධ නිලධාරීන්, පාසැල් ළමුන් හා මගීන් ඒ ඒ පාර්ශවයන්ට අදාල ක්ෂේත්‍ර ඔස්සේ දැනුවත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

## බස් හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුව

ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් නිකුත් කරන මගී සේවා අවසරපත්‍ර ලබා ඇති බස්රථ හිමිකරුවන් සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව අතර, නිරන්තර සහයෝගීතාවය රඳවා ගත යුතු බැවින් සහ කොමිෂන් සභාව විසින් වරින්වර ක්‍රියාත්මක කරනු ලබන පනවනු ලබන නීති අණපනත් පිළිබඳව බස්රථ හිමියන් දැනුවත් කිරිම සඳහා නැගෙනහිර, සබරගමුව, වයඹ, ඌව, උතුරුමැද, මහනුවර හා බස්නාහිර පළාත් සඳහා වැඩමුළු 07 පවත්වනු ලැබීය.






## ප්‍රවාහනයට සම්බන්ධ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව

ප්‍රවාහනයට සම්බන්ධ බලයලත් ආයතන වල නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කර්තව්‍ය වන බැවින් එම පළාත් ප්‍රවාහන අධිකාරී වල සේවයේ නියුතු වගකිව යුතු නිලධාරීන් ප්‍රවාහනය සම්බන්ධ දේශන මෙන්ම ආයතනයක ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීම, පෞරුෂ වර්ධනය යන මාතෘකා යටතේ දැනුම ලබාදීමට මෙම වැඩමුළුව සංවිධානය කරනු ලැබීය.





වැඩමුළුවට සහභාගි වූ නිලධාරීන් පිරිසක්

**<u>පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළු</u>**

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව සම්පාදනය කෙරෙන ‘2017 ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛණ වාර්තාව’ අනුව පසුගිය වසර 3හි ශ්‍රී ලංකාවේ සිදු වූ මාර්ග අනතුරු සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වෙමින් පවතින බව පෙනේ. ඒ අනුව මාර්ග අනතුරු නිසාම මරණයට පත්වන හා තුවාල ලබන පිරිසද වැඩිවීම සිදුවේ. එදිනෙදා සිදුවන මාර්ග අනතුරු බොහොමයක් නොසැලකිලිමත් රිය ධාවනය හා නොසැලකිලිමත් මාර්ග භාවිතය හේතුවෙන් සිදුවන බැවින් පාසල් වියේ පසුවන දරුදැරියන් කුඩා වයසේ සිටම නිවැරදි, ආරක්ෂාකාරී මෙන්ම මනා සිහි කල්පනාවෙන් යුතුව මහාමාර්ගය භාවිතා කිරීමටත් මාර්ග අනතුරු වලක්වා ගැනීමටත් බල ගැන්වීම ඉතාමත් කාලෝචිත කාලීන අවශ්‍යතාවයකි. එහෙයින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව අනාගත දරු පරපුරත් සමස්ථ රටේ උන්නතියත් අපේක්ෂාවෙන් මෙම වැඩමුළු මාලාව සංවිධානය කරන ලදී.

ඒ අනුව දසදහසකට අධික පාසල් ප්‍රමාණයක් පවතින බැවින් සියළුම පාසල් නියෝජනය වන පරිදි සෑම පාසලකම රථ නියාමන කණ්ඩායම් දැනුවත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව කලාප මට්ටමින් පාසල් තෝරාගෙන රථ නියාමන කණ්ඩායම් දැනුවත් කිරීම දැනට සිදු කරනු ලබයි. වැඩමුළුව අවසානයේ පාසල් සඳහා රථ නියාමන කට්ටල පරිත්‍යාග කිරීමද, දරුවන් සඳහා සහතික පත්‍රයක් ලබාදීමද සිදුකරනු ලබයි.

2018 වර්ෂයේදි පාසල් රථ නියාමන දරුවන් පුහුණු කිරීමේ වැඩමුළු 21 පවත්වන ලදි. මෙම වැඩමුළු තිරසර පාසල් ව්‍යාපෘතිය යටතේ පවත්වනු ලැබූ අතර, වැඩමුළු පැවැත්වීම ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ද මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලදි. ඒ අනුව වලපනේ, හම්බන්තොට, තංගල්ල, අකුරැස්ස, මාතර, ගාල්ල, කොළඹ, හොරණ, රත්නපුර, බලංගොඩ, මාවනැල්ල, කෑගල්ල, දෙහිඕවිට, ගම්පහ, කලුතර, මතුගම, කන්තලේ, ත්‍රිකුණාමලය, අම්පාර, කල්මුණේ සහ මඩකලපුව යන ස්ථානවල පවත්වන ලදි. මෙම වැඩමුළුවලදි රථ නියාමන දරුවන් 10000 ට ආසන්න ප්‍රමාණයක් පුහුණු කරන ලද අතර, සියලු පාසල් සඳහා රථ නියාමන කට්ටලය බැඟින් පරිත්‍යාග කරන ලදි. එම පරිත්‍යාග සඳහා පීපල්ස් ලීසිං ආයතනය හා ෆෙයා ෆස්ට් ආයතන අනුග්‍රාහක දායකත්වය සලසන ලදි.





වැඩමුළුවට සහභාගි වූ පාසල් සිසුන් පිරිසක්

2018 වර්ෂය තුලදී මේ වෙනුවෙන් දරන ලද පිරිවැය රුපියල් මිලියන 6.12 ක් විය.

## 8. අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන හා උප කාර්යාලයීය පරිඝනක පද්ධතිය හා ජාල පද්ධතිය උක්ත වර්ෂය තුළදී ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු සිදු කිරීම සාර්ථකව සිදු කළ අතර කල් ඉකුත් වූ පරිඝනක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා නව පරිඝනක යන්ත්‍ර සහ බහුවිධ කාර්යයන් සහිත ඡායා පිටපත් යන්ත්‍ර යෙදවීම සිදු විය.

තවද දිගු කාලයක සිට ආයතනය තුළ ක්‍රියාත්මක කිරීමට ප්‍රයන්ත දැරූ මධ්‍යගත දත්ත පාදක පද්ධතිය මගින් සියළුම දෙපාර්තුමේන්තු මනාව සමායෝජනය සිදු කිරීම මෙම වර්ෂය තුළදී ආරම්භ කිරීම එනම් ආයතනය තුළ පවතින සියළුම ක්‍රියාවලීන් හඳුනාගෙන එම ක්‍රියාවලීන් එකිනෙකට සම්බන්ධ වන ලෙස මධ්‍යගත දත්ත පාදක පද්ධතියක් ඇති කිරීමේ අරමුණැතිව ආයතනයේ සියළුම ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරන පද්ධතියක් ස්ථාපනය කිරීම (Process Automation System) ICTA ආයතනය , මොරටුව විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාල වල උපදේශකත්වය යටතේ අදියර කිහිපයකින් ඉදිරියට යන ලෙස ආරම්භ කර මේ වන විට ඉන් පළමු අදියර සාර්ථකව අවසන් කර එය සජීවී මෙහෙයුම් කටයුතු (Live Operation) ක්‍රියත්මක කර ඇත.

එමෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පවත්නා තොරතුරු යාවත්කාලීන කිරීම හා නව තොරතුරු ඇතුළත් කිරීමත් සෙවීම පහසු කිරීමේ ක්‍රමවේද ද හඳුන්වා දීමත් සිදු කරන ලද අතර බස් ගාස්තු පිළිබඳ දත්ත, අන්තර් පළාත් බස් රථ කාලසටහන්, අන්තර් පළාත් බස් රථ ධාවනය වන මාර්ග ඇතුළත් සිතියම්, මගී ප්‍රවාහන සේවා බලපත්‍ර හා සම්බන්ධ ටෙන්ඩර් පිළිබඳ තොරතුරු ඇතුළු දෑ වෙබ් අඩවිය හරහා පහසුවෙන් ලබාගත හැකි පරිදි වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම නව ප්‍රවේශයකින් යුතුව නව මුහුණුවරකින් සිදුකර ඇත.

බැස්ටියන් මාවත බස් පර්යන්තයේ සහ ප්‍රධාන බස් නැවතුම්පල 6 ක සවි කර තිබෙන විද්‍යුත් තොරතුරු පුවරු (Digital Display Boards –LED Panels) යාවත්කාලීන කර සහ නිසි පරිදි ක්‍රියාත්මක තත්ත්වයට ගෙන එය මාධ්‍ය ආයතනයක් හරහා නඩත්තු හා සේවා කටයුතු සිදු කරමින් ඉදිරියට පවත්වාගෙන යාම සාර්ථක ලෙස සිදු කරන ලදි.

බැස්ටියන් මාවත උප කාර්යාල පරිශ්‍රයේ සවිකර CCTV කැමරා පද්ධතිය නිසි ලෙස ක්‍රියා නොකරන බැවින් ඒ සඳහා නව තාක්ෂණයෙන් පිරිපුන් CCTV කැමරා පද්ධතියක් අදාල බස් නැවතුම්පලම ආවරණය වන පරිදි සහ වව්නියාව බස් නැවතුම්පලද ආවරණය වන පරිදි සවි කිරීම් සිදු කිරීම සාර්ථකව අවසන් කරන ලදි. තවද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය පරිශ්‍රය තුලද CCTV කැමරා පද්ධතියක් සවිකර ඇති අතර ඉහත පද්ධතින් ප්‍රධාන කාර්යාලය මගින් නිරික්ෂණය සිදු කරනු ලබයි.

මෙයට අමතරව එමෙන්ම මගී ජනතාවට ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීමේ අරමුණැතිව අන්තර් ජාලය ඔස්සේ (මාර්ගගත) ආසන වෙන් කිරීමේ පද්ධතියක් (Online Bus Ticket Reservation System) මොරටුව විශ්ව විද්‍යාලය මගින් අදාල මෘදුකාංග සංවර්ධනය සිදු කර මේ වන විට හඳුන්වා දී ඇත.

## 9. ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ

මේ යටතේ ප්‍රධාන වශයෙන් අන්තර් පළාත් බස් රථ ධාවනයට අදාල මගී ඉල්ලුම් සමීක්ෂණ සිදුකරනු ලබන අතර එමගින් සපයනු ලබන නිවැරදි දත්ත ක්‍රමවත් කාලසටහන් සකස් කිරීම සඳහාත් මතුවන ගැටලු අවම කරගැනීම සඳහාත් ඉවහල් වේ. මීට අමතරව අන්තර් පළාත් මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේදී හා ප්‍රතිපත්ති සකස්කිරීමේදීත්, සැලසුම් සම්පාදනය කිරීමේදීත් පවත්නා වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම සිදු කරන අවස්ථා වලදී අවශ්‍ය දත්ත සැපයීම සමීක්ෂණ ඒකකය විසින් සිදුකරනු ලබයි. ඒ අනුව පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන්නන් සහ බස්රථ ධාවකයන් යන දෙපාර්ශවයටම සාධාරණත්වය ඉටු වන පරිදි ඉල්ලුම සහ සැපයුම ප්‍රශස්ථ ලෙස හැසිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දත්ත සම්පාදනය කිරීම සමීක්ෂණ ඒකකයේ ප්‍රමුඛ කාර්යය වී තිබේ.

2018 අගෝස්තු මාසය අවසන් වන විට සමීක්ෂණ 22ක් සිදුකර ඇති අතර මගී ඉල්ලුම සම්බන්ධව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් මීගමුව 18 කණුව, බහුවිධ භුවමාරු මධ්‍යස්ථානයේ පිහිටුවීමට යෝජිතව පවතින බවත්, ඒ අනුව මීගමුව හා 18 කණුව ආශ්‍රිත ප්‍රදේශය තුළ මගී ඉල්ලුම පිළිබඳව තක්සේරු සමීක්ෂණයක් සිදු කර දෙන ලෙස මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීම අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් එම තක්සේරු වාර්තා සකස් කිරීම කළ අතර මෙමගින්, ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත උපදේශන ගාස්තු වශයෙන් රුපියල් 1,478,250.00ක මුදලක් උපයා ගැනීමට හැකි විය.



නැගෙනහිර පළාතේ තොප්පිගල ප්‍රදේශයේ ගැමිසැරිය
සඳහා සමීක්ෂණයක් සිදුකළ අවස්ථාවක්



## 10. පොදු ප්‍රවාහනය සඳහා ජී පී එස් (GPS) තාක්ෂණය උපයෝගී කරගැනීම

පොදු ප්‍රවාහන සේවාවේ පැන නැගී තිබෙන අභියෝගාත්මක ගැටළු විසඳීම පාදක කර ගනිමින් ගුණාත්මක මෙන්ම ආරක්ෂිත පොදු ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීම උදෙසා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පොදු ප්‍රවාහන සේවාවට යොදා ගැනීමක් ලෙස ජී.පී.එස් . තාක්ෂණය සහ අනෙකුත් තාක්ෂණ විධි බද්ධ කරගනිමින් අන්තර්පළාත් බස් රථ නියාමනය කිරීම ප්‍රථම වරට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදි.




ජී.පී.එස්.(GPS) මෙහෙයුම්

මෙම ව්‍යාපෘතිය යටතේ 2017 වසර තුළ ජී.පී.එස් උපකරණ අක්‍රියව තිබූ බස් රථ නැවත ක්‍රියාත්මක කිරීම පදනම් කරගෙන  අදාල ක්‍රම වේදය ප්‍රති සංවිධානය සිදු කරන ලදි.ඒ අනුව සියළුම බස් රථ වල ජී.පි.එස් උපකරණ සවි කිරීම සහ අක්‍රිය උපකරණ නැවත ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම අදාල බස් හිමිකරුගේ වගකීමක් ලෙස බලපත්‍ර කොන්දේසි බලාත්මක කරන ලද අතර 2018 වර්ෂයේ දී සියලු සුඛෝපභෝගී සහ අධි සුඛෝපභෝගී බස් රථ වල ජී.පි.එස් උපකරණ ක්‍රියාත්මක තත්වයට ගෙන එන ලදී.

තවද අන්තර් පළාත් සාමාන්‍ය සහ අර්ධ සුඛෝපභෝගී සේවා සඳහාද ජීපීඑස් තාක්ෂණය හඳුන්වා දෙන ලද අතර එම සේවාවේද ජීපීඑස් උපකරණ සවිකිරීම සිදුවෙමින් පවතී. එමෙන්ම නව තාක්ෂණයෙන්

පිරිපුන් මෙහෙයුම් මැදිරිය මගින් ජීපීඑස් උපකරණ සවිකරන ලද බස් රථ නියාමනය කිරීම සිදුවෙමින් පවතී.

මෙම උපකරණ පද්ධතිය ධාවනය වන බස් රථවල වේගය පාලනය කරමින් අනතුරු හැඟවීමේ සංඥාවක් බස් රථය තුළදී නාද වීමටත් ඊට සමාන්තරව පාලන මැදිරියේ ඒ පිළිබඳව සටහන් වීමත් හේතුවෙන් මේ වන විට ජී. පී.එස්. උපකරණ ස්ථාපිත කර ඇති බොහෝ බස් රථ අධික වේගයෙන් ධාවනය කිරීම සීමා කර ඇත. මීට අමතරව මහජන පැමිණිලි ඒකකයට සම්බන්ධිත ක්ෂණික දුරකථන ඇමතුම් අංශය වෙත ලැබෙන පැමිණිලි ක්ෂණිකව විසඳීමටත් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් හැකි වී ඇත.

තවද ජීපීඑස් උපකරණ සවිකරන ලද බස් රථ වල ධාවන තත්වයන් පිලිබඳ තොරතුරු ධාවකයින් සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ඉහළ නිලධාරීන් දැනුවත් කිරීම පිණිස කෙටි පණිවිඩ සේවාවක් හඳුන්වා දුන් අතර බස් රථවල ධාවන ස්ථානයන් පිළිබඳ තොරතුරු මගී ජනතාව දැනුවත් කිරීම පිණිස 1955 ක්ෂණික ඇමතුම් අංකය හඳුන්වා දෙන ලදී.

මේ සඳහා 2018 වර්ෂය තුළ රු.මි. 3.19 ක සමුච්චිත වියදමක් දරා ඇත.

## 11. බස්රථ භෞතික අන්දමින් පරීක්ෂා කිරීම

ශ්‍රී ලංකාවේ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් වර්තමානයේ බොහෝ ගැටළු නිර්මාණය කරමින් මගීන් පොදු මගී ප්‍රවාහන සේවාව ප්‍රතික්ෂේප කරමින් පුද්ගලික ප්‍රවාහන මාධ්‍ය භාවිතා කිරීමට පෙළඹීමේ ප්‍රවණතාවයක් පැහැදිලිව දක්නට ඇති අතර මේ සඳහා බස් සේවාවන්හි පවතින පහසුකම් වල අඩුපාඩු, දුර්වලතා සහ අකාර්යක්ෂමතාව බලපා ඇත. එහෙයින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව අන්තර් පළාත් දුරගමන් සේවා බස් රථ විශේෂයෙන්ම මගීන්ට කායික හා මානසික අපහසුවකින් තොරව නියමිත වේලාවට ගමනාන්තය කරා යාමට හැකි පහසුකම් සහිතව ක්‍රියාත්මක කිරීම සඳහා මහත් පරිශ්‍රමයක් දරමින් සිටී. ඒ අනුව එම බස්රථවල යෝග්‍යතාවය සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කරනු ලබන අතර මගීන්ගේ ආරක්ෂාව සහ සුවපහසුබව තහවුරු කිරීමේ අරමුණින්, අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර බස් රථවල ඒ ඒ සේවා වර්ගයට අනුකූලව තිබිය යුතු පිරිවිතරයන් පිළිබඳව පූර්ණ පරීක්ෂාවක් සිදුකරනු ලැබේ. ඒ අනුව, බස්රථය ඇතුළත හා පිටත ඝෝෂාකාරී තත්ත්වය (noise level), පා පුවරු, දොරවල්, හදිසි දොරටු නිසි පරිදි ක්‍රියා කරනවාද යන්නත්, ආසනවල දිග, පළල, උස සහ ආසන අතර පරතරය ආදිය අදාල පිරිවිතරයන්ට අනුකූලද යන්නත්, බස්රථය තුළ පවිත්‍රතාවය ප්‍රශස්ථ මට්ටමින් පවතීද යන්නත්, සීනු පද්ධතිය, ප්‍රධාන ලාම්පු, සංඥා ලාම්පු ආදිය නිසි පරිදි ක්‍රියාත්මක ද යන්නත් ආදී වශයෙන් බස්රථයේ සියළු භෞතික තත්ත්වයන් පරීක්ෂා කර වාර්තාවක් නිකුත් කරනු ලැබේ. මගී ප්‍රවාහනය සඳහා යෙදවීමට ඉදිරිපත් කරනු ලබන සෑම බස්රථයක් සඳහාම මෙම වාර්තාව ලබාගෙන ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ඒ අනුව නව අන්තර් පළාත් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේදී හා ධාවනයෙන් ඉවත් කරන ලද බස්රථ වෙනුවට නව බස්රථ ආදේශ කිරීමේදී, මෙම වාර්තාවේ අඩංගු කරුණු සැලකිල්ලට ගෙන, අදාල නිකුත් කිරීම පිළිබඳ අවසන් තීරණය ගනු ලැබේ.


## 12. අන්තර්පළාත් මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරීම

ශ්‍රී ලංකාවේ පොදු මගී ප්‍රවාහන සේවාව නගා සිටුවීම සඳහා දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරමින් අන්තර් පළාත් පෞද්ගලික බස්මගී ප්‍රවාහන සේවාව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන අතර අන්තර් පළාත් පෞද්ගලික බස්රථ සේවාව ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීමත් මගී ප්‍රවාහන අවසරපත්‍ර නිකුත් කිරීමත් සිදු කරනු ලැබේ. අන්තර් පළාත් මාර්ග වල පොදු මගී ප්‍රවාහන සේවා සඳහා අවතීර්ණ වන බස්රථවලට මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම, ටෙන්ඩර් පටිපාටියක් ඔස්සේ සිදුකරනු ලබන අතර එම ක්‍රමවේදය අනුගමනය කිරීම මගින් උපරිම විශ්වාසය හා විනිවිද භාවයකින් යුක්තව අදාල කාර්යය ඉටු කරනු ලැබේ.

අන්තර් පළාත් පෞද්ගලික බස්රථ සේවාව සේවා වර්ග 4කින් සමන්විත වන අතර 2018.12.31 වනවිට ඒ ඒ සේවා වර්ගය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති වලංගු මගී සේවා අවසරපත්‍ර ප්‍රමාණය පහත වගුවෙහි දැක්වේ.

| සේවා වර්ගය | මගී සේවා අවසරපත් (බස්රථ) සංඛ්‍යාව |
|---|---|
| සාමාන්‍ය | 2001 |
| අර්ධ සුඛෝපභෝගී | 435 |
| සුඛෝපභෝගී | 601 |
| අධි සුඛෝපභෝගී | 113 |
| **එකතුව** | **3150** |

මූලාශ්‍රය - ධාවන හා සේවා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාගකොස




ජාගකොස මගින් ක්‍රියාත්මක කෙරෙන බස්රථ සේවා වර්ග

## 13. මහජන පැමිණිලි

පොදු බස් සේවාව භාවිතා කරන මගී ජනතාවට විශ්වාසදායී, ආරක්ෂිත මෙන්ම සුවපහසු සේවාවක් සළසා දීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ඒකායන අරමුණ වුවද අපේක්ෂිත සුහදශීලී සේවාව වෙනුවට මගී ජනතාව විවිධ අපහසුතාවයන්ට ලක්වන බව වාර්තා වේ එබැවින් දවසේ පැය 24 පුරාම පැමිණිළි ඉදිරිපත් කිරීමට හැකිවන සේ මේ සඳහාම වෙන්වූ විශේෂ කේත අංකයක් (1955) සමඟ ක්ෂණික දුරකථන ඇමතුම් අංකයක් (0112595555) හඳුන්වා දී ඇත. ඊට අමතරව පහත ආකාරයට මහජන පැමිණිලි ඒකකය වෙත පැමිණිලි ලැබේ.

- ලිඛිතව පැමිණ භාරදෙන පැමිණිලි
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින්
- බැස්ටියන් මාවත කාර්යාලය මගින්
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින්
- ජනපතිට කියන්න වැඩසටහන මගින්
- විද්‍යුත් තැපැල info@ntc.gov.lk මගින්
- ෆැක්ස් මගින්

මහජන පැමිණිලි ඒකකය වෙත ලැබෙන ප්‍රධාන පැමිණිලි වර්ගීකරණය කර පහත වගුවෙහි දක්වා ඇති අතර



මහජන පැමිණිලි විභාග කරන අවස්ථාවක්

මූලාශ්‍රය - තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව - ජාගකොස

| අනු අංකය | විස්තරය | සංකේත අංකය | ලද පැමිණිලි සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1 | වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම | SE02 | 1010 | 26% |
| 2 | මගීන්ට ආචාරශීලි නොවීම | SE05 | 975 | 25% |
| 3 | නියමිත ප්‍රමාණයට වඩා වැඩි මගීන් රැගෙන යාම | MJ09 | 172 | 4% |
| 4 | නියමිත පරිදි ප්‍රවේශ පත්‍ර නිකුත් නොකිරීම | MJ06 | 373 | 10% |
| 5 | නොසැළකිල්ලෙන් රිය පැදවීම | MJ11 | 425 | 11% |
| 6 | මාර්ග බලපත්‍ර නොමැතිව ධාවනය කිරීම | MJ05 | 16 | 0% |
| 7 | අතරමග ස්ථානවල අනවශ්‍ය ආකාරයට බස්රථය නවත්වා මගීන් එකතු කිරීම | PC02 | 124 | 3% |
| 8 | නියමිත කාලසටහන උල්ලංඝනය කිරීම | MJ02 | 276 | 7% |
| 9 | නියමිත ස්ථානයෙන් ගමන් ආරම්භ නොකිරීම හා ගමනාන්තය දක්වා ධාවනය නොකිරීම | MN02 | 248 | 6% |
| 10 | බස් රථය මගී ප්‍රවාහනයට සුදුසු තත්ත්වයේ නොතබීම | SE04 | 75 | 2% |
| 11 | වායු සමීකරණ නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම | MJ04 | 59 | 2% |
| 12 | අධික ශබ්දයෙන් කැසට්/ රේඩියෝ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම/ නොගැලපෙන වීඩියෝ පට ප්‍රදර්ශනය | PC01 | 69 | 2% |
| 13 | මගී ප්‍රවාහන බස්රථ අතර ඇතිවන ගැටුම් | Bus to Bus | 52 | 1% |
| | එකතුව | | **3874** | **100%** |

ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබෙන මහජන පැමිණිලි අතරින් අන්තර් පළාත් බස් සේවාවන්ට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභා කාර්යාලය තුළදී පරීක්ෂණ කටයුතු මෙහෙයවා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා අතර පළාත්බද සේවාවන්ට අදාළ පැමිණිලි, අදාල පළාත් ප්‍රවාහන අධිකාරි වෙත යොමු කිරීමටත් ශ්‍රී ලංගම සේවාවන්ට අදාල පැමිණිලි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති වෙත යොමු කිරීමටත් කටයුතු කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහජන පැමිණිළි අංශය වෙත ලැබුණු එම පැමිණිලි 3874 අතුරින් 2018 දෙසැම්බර් 31 වන විට එම පැමිණිලි අතුරින් 3235 ක් එනම් 84% ක් සම්බන්ධයෙන් විසඳුම් ලබාදී ඇත.

## 14. ජංගම පරීක්ෂණ හා විමර්ශනය

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව අන්තර් පළාත් මගී ප්‍රවාහන පෞද්ගලික බස්රථ සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ. එම අවසරපත්‍ර යටතේ ධාවනය කරනු ලබන බස්රථ වෙනුවෙන් කොන්දේසි මාලාවක් පනවා ඇති අතර එම කොන්දේසි පිළිපැදීම/කඩ කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම, ජංගම පරීක්ෂණ ඒකකය විසින් ඉටු කරනු ලබයි. එම පරීක්ෂණ වලදී අවසරපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් අන්තර් පළාත් මාර්ගයන්හි ධාවනය කරන බවට අනාවරණය වුවහොත් අදාල බස්රථ පිළිබඳව විමර්ශනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. මගී සේවා අවසරපත්‍ර නොමැතිව අන්තර් පළාත් බස්රථ ධාවනය වන බස්රථ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන්

සහය වීමත් මගින් ගුණාත්මක මගී ප්‍රවාහන සේවා සැපයීම වෙනුවෙන් දායකත්වය ලබා දීමත් ජංගම පරීක්ෂණ ඒකකය විසින් සිදු කරනු ලැබේ.


තවද ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් රජයේ සහනාධාර ඇතිව ක්‍රියාත්මක කරනු ලබන 'සිසුසැරිය' පාසල් බස්රථ සේවාව, ගැමි සැරිය හා 'නිසිසැරිය' රාත්‍රී බස්රථ සේවාව යන සේවාවන් අධීක්ෂණය කිරීමේ කටයුතු ද මෙම ඒකකය මගින් ඉටු කරනු ලබයි. 2018 වර්ෂය තුළදී ජංගම පරීක්ෂණ ඒකකය විසින් සිදුකරන ලද බස්රථ පරීක්ෂා කිරීම් සංඛ්‍යාව 19587 ක් වන අතර 'සිසුසැරිය' ව්‍යාපෘතියට අදාලව බස්රථ 646ක් පරීක්ෂාවට ලක්කර ඇත. අධිකරණය වෙත යොමු කල බස්රථ සංඛ්‍යාව 74 කි.

2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා වර්ෂය තුළ විමර්ශන ඒකකය වෙත ලැබී ඇති විමර්ශන සංඛ්‍යාව 3154 කි. එම වර්ෂය තුලදී අවසන් කරන ලද විමර්ශන සංඛ්‍යාව 3021 කි. විමර්ශනය සඳහා ඉදිරිපත් නොවූ සංඛ්‍යාව 133 කි. මගී සේවා අවසර පත්‍ර යාවත්කාලීන කරනු ලබන අවස්ථාවේදී විමර්ශනය නොකරන ලද සියළුම විමර්ශන ගැන අවධානය යොමු කරන අතර විමර්ශන කටයුතු අවසන් කර ගෙන පමණක් අවසර පත්‍රය නැවත වලංගු කිරීම සිදු කරනු ලබයි..

| | |
|---|---|
| ලැබුණු විමර්ශන වාර්තා ප්‍රමාණය | 3154 |
| අවසන් කරන ලද විමර්ශන වාර්තා ප්‍රමාණය | 3021 |
| විමර්ශනය කර අවසන් නොකරන ලද විමර්ශන වාර්තා ප්‍රමාණය | 133 |
| ලද විමර්ශන වාර්තා වලට අදාල කොන්දේසි කඩකිරීම් ප්‍රමාණය | 5326 |
| විමර්ශනය කර අවසන් කරන ලද කොන්දේසි කඩකිරීම් ප්‍රමාණය | 5122 |
| රියදුරු/කොන්දොස්තර පුහුණුවට යොමු කරන ලද ප්‍රමාණය | 278 |
| රියදුරු/කොන්දොස්තර සේවය අත්හිටුවන ලද ප්‍රමාණය | 275 |

ජංගම පරීක්ෂණ හා විමර්ශන සාරාංශය

## 15. ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව



ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ලංකා වරාය අධිකාරිය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය ඇතුළු ප්‍රවාහනය සම්බන්ධිත සම්බන්ධිත ආයතන රාශියකින් තොරතුරු හා දත්ත ඒකරාශී කර එම දත්ත විශ්ලේෂණය කර ඉතා ආකර්ෂණීය ලෙස සකස් කරනු ලබන මෙම 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව' අඛණ්ඩව වර්ෂයක් පාසා මුද්‍රිත ග්‍රන්ථයක් වශයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම එළිදක්වනු ලැබේ.

ගොඩබිම, ජලය හා ගුවන් යන මාධ්‍ය තුන හරහා සිදුකරන සියළු ප්‍රවාහන කාර්යයන් පිළිබඳ තොරතුරු එකම ස්ථානයකින් ලබාගතහැකි ක්‍රමයක් ලෙස 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව' මේ වන විට ප්‍රවාහන ක්ෂේත්‍රයේ සියළු විද්වතුන්ගේ පැසසුම් ලබන මාහැඟි ග්‍රන්ථයක් වී තිබේ. ප්‍රවාහනය පිළිබඳ පර්යේෂණ කරන සැලසුම් සකස් කරන ආයතන හා බලධාරීන්ට මෙන්ම ප්‍රවාහනය පිළිබඳ අධ්‍යයන කටයුතු වල යෙදෙන අයටද මෙම වාර්තාව පරිශීලනය කිරීම එම කටයුතු සඳහා මහත් පිටුවහලක් වනු ඇත.

2018 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වන විට ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛණ 2017 වාර්තාව බෙදාහැරීමේ කටයුතු අවසන් කරමින් පැවති අතර 2018 වර්තාව සඳහා තොරතුරු එක්රැස් කිරීම සිදුකරමින් පැවතිනි. මෙම වාර්තාව දිවයින පුරා පිහිටි ප්‍රවාහනයට සම්බන්ධ විවිධ ආයතන, මහජන පුස්තකාල, ප්‍රධාන පාසල් හා විශ්ව විද්‍යාල වලටත් බෙදා හැරීම සිදු කරන අතර උසස් අධ්‍යාපන කටයුතු සඳහා ඉල්ලුම් කරන ඕනෑම අයෙකුටද ලබා දෙනු ලැබේ. 2017 වාර්තාව මුද්‍රණය කර බෙදා හැරීම සඳහා රුපියල් මිලියන 1.24ක මුදලක් වැය කරන ලදී.

## 16. සේවක පුහුණුව හා සංවර්ධනය

ජාතික ගමනාගමන කොමිෂන් සභාව සෑම වර්ෂයක් පාසාම ආයතනයේ සේවක මණ්ඩලය විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා වලට යොමු කිරීම තුළින් ආයතනයට අවශ්‍ය වන්නාවූ දැනුම හා කුසලතා වලින් පිරිපුන් සේවක මණ්ඩලයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව 2018 වර්ෂය තුළද දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා රැසක් සඳහා සේවකයින් යොමු කර ඇත. ව්‍යාපෘති යෝජනා සකස් කිරීම, පුද්ගලික ලිපිගොනු කළමනාකරණය. ගබඩා කළමණාකරණය හා පොදු දේපල අපහරණ ක්‍රියාවලිය, සිද්ධි කළමනාකරණය, ගිණුම්කරණය, Tally Pacage ආදී තේමාවන් රැසක් ඔස්සේ දේශීය වශයෙන් වැඩසටහන් 25ක් සඳහා නිලධාරීන් යොමු කරන ලද අතර සියළු නිලධාරීන් දින 3ක Outbound Training සඳහා යොමු කරන ලදී. මීට අමතරව 'Management Audition for the Public Sector Internal Auditors', 'Smart Mobility & Intellegent Transport Innovation', 'Transport Planning Implementation, Monitoring & Evaluation, Public Transportation Management Strategies' 'Operation of the Multimodal Centers' හා 'Transportation Research & Injury Prevention'ආදී වශයෙන් මැලේසියාව, සිංගප්පූරුව, ජපානය හා ඉන්දියාව යන රටවල පැවති පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 20දෙනෙකු සහභාගී කරවන ලදී.

2018 වර්ෂය තුළ 'සේවක පුහුණුව හා සංවර්ධනය' යටතේ දේශීය පුහුණු වැඩසටහන් සඳහා රු. මිලියන 1.75ක්ද විදේශීය පුහුණු වැඩසටහන් සඳහා රු. මිලියන 4.98ක් පිරිවැයක් දරා ඇත.

# වාර්ෂික ගිණුම්

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව** *(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| **දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය** | සටහන් | **2018** | **2017** |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | **4** | 437,738,323.02 | 425,777,634.48 |
| නොනිමි වැඩ | | 15,670,425.44 | - |
| පුස්තකාල පොත් | | 1,177,108.81 | 1,077,109.81 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **454,585,857.27** | **426,854,744.29** |
| **ජංගම වත්කම්** | | | |
| ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම් | **5** | 3,773,484.31 | 3,859,132.93 |
| ලැබීම් - සේවක | **6** | 22,862,775.00 | 20,341,998.00 |
| ආයෝජන - කාලීන තැන්පත් | **7** | 34,890,548.09 | 31,724,072.16 |
| ආයෝජන - භාණ්ඩාගාර බිල්පත් | **8** | 12,707,047.00 | 11,610,112.00 |
| පොළී ආදායම් ලැබීම් | | 3,426,181.97 | 1,753,342.03 |
| මුදල් හා මුදල් සමාන දෑ | **9** | 454,002,393.91 | 491,688,853.64 |
| **මුළු ජංගම වත්කම්** | | **531,662,430.28** | **560,977,510.76** |
| **මුළු වත්කම්** | | **986,248,287.55** | **987,832,255.05** |
| **බැරකම්** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| රජයේ ප්‍රතිපාදන | **10** | 295,050,931.97 | 322,307,201.26 |
| පාරිතෝෂික වෙන්කිරීම් | **11** | 40,817,143.00 | 37,088,716.75 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **335,868,074.97** | **359,395,918.01** |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු වියදම් | **12** | 62,991,771.04 | 55,540,722.17 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | | 65,718,904.00 | 47,935,404.00 |
| වෙන්කිරීම් හා උපචිත වියදම් | **13** | 37,369,501.43 | 105,944,737.15 |
| **මුළු ජංගම බැරකම්** | | **166,080,176.47** | **209,420,863.32** |
| **සමුච්චිත අරමුදල** | | **484,300,036.11** | **419,015,473.72** |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | **986,248,287.55** | **987,832,255.05** |

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කර ඇති බවට සහතික කරන ලදී.

..............................................

**අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන)**

මූල්‍ය ප්‍රකාශන වල අංක 05 සිට 08 දක්වා පිටු වල දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා අංක 09 සිට 15 දක්වා පිටු වල දක්වා ඇති සටහන් වලට අනුගතව සකස් කර ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකියනු ලැබේ.

.............................................. ..............................................

**සභාපති** **කොමිෂන් සභාවේ සාමාජික**

**දිනය: 2019.04.11.**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව** *(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් කාර්යඵලය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| ආදායම | | | |
| ආදායම | **14** | 418,679,359.10 | 434,824,751.08 |
| වෙනත් අදායම් | **15** | 66,991,441.14 | 68,066,700.31 |
| **එකතුව** | | **485,670,800.24** | **502,891,451.39** |
| **වියදම්** | | | |
| **මෙහෙයුම් වියදම්** | **16** | | |
| සේවක පාරිශ්‍රමික | **16.1** | 138,506,393.93 | 124,463,991.03 |
| ප්‍රවාහන වියදම් | **16.2** | 19,482,574.78 | 10,655,493.24 |
| විශේෂ රැස්වීම් සඳහා වියදම් | | 166,000.00 | - |
| ප්‍රවාහන සංවර්ධන කාර්යයන් | **16.3** | 4,426,999.95 | 2,386,000.94 |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | **16.4** | 47,560,545.84 | 43,457,777.08 |
| ස්ථාවර වත්කම් අලුත් වැඩියා සහ නඩත්තු | **16.5** | 2,156,067.29 | 3,693,323.62 |
| සේවක සුභසාධනය | **16.6** | 9,759,278.93 | 8,946,466.47 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | **16.7** | 2,764,349.57 | 988,053.05 |
| නීති හා වෙනත් ගාස්තු | **16.8** | 1,450,647.50 | 811,284.50 |
| සන්නිවේදන වියදම් | **16.9** | 2,622,542.25 | 2,201,997.50 |
| ක්ෂය වීම් | **16.10** | 21,042,889.01 | 22,286,622.45 |
| මූල්‍ය ගාස්තු | **16.11** | 47,178.38 | 61,302.42 |
| සේවක පාරිශ්‍රමික | **16.12** | 583,757.50 | 312,647.44 |
| **මුලු මෙහෙයුම් වියදම්** | | **250,569,224.93** | **220,264,959.74** |
| **වර්ෂය සඳහා අතිරික්තය / (ඌණතාවය)** | | **235,101,575.31** | **282,626,491.65** |
| **මෙහෙයුම් නොවන ආදායම්** | **17** | **129,240.00** | **-** |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)** | | **235,230,815.31** | **282,626,491.65** |
| **රජයෙන් ලැබුණු ප්‍රතිපාදන** | | | |
| ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රතිපාදන ලැබීම් | **18** | **400,000,000.00** | **462,100,000.00** |
| **විශේෂ ව්‍යාපෘති වියදම්** (රජයේ ප්‍රතිපාදන) | **19.1** | **(400,000,000.00)** | **(461,147,139.71)** |
| **විශේෂ ව්‍යාපෘති වියදම්** (ජාගකොස ප්‍රතිපාදන) | **19.2** | **(69,946,252.92)** | **(114,142,198.98)** |
| **වර්ෂය සඳහා අතිරික්තය / (ඌණතාවය)** | | **165,284,562.39** | **169,437,152.96** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව** *(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම/හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | සමුච්චිත අතිරික්තය (ඌනතාවය) |
|---|---|
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 249,578,320.76 |
| අදාල වසර සඳහා අතිරික්තය/ ඌනතාවය | 169,437,152.96 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 419,015,473.72 |
| භාණ්ඩාගාරය වෙත හරවා යවන ලද මුදල් | 100,000,000.00 |
| අදාල වසර සඳහා අතිරික්තය/ ඌනතාවය | 165,284,562.39 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 484,300,036.11 |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව** *(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| **2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය** | සටහන් | **2018** | **2017** |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| වසර සඳහා අතිරික්තය / ඌනතාවය | | 165,284,562.39 | 169,437,152.96 |
| **මුදල් නොවන චලනයන්** | | | |
| ක්ෂය වීම් | | 21,042,889.01 | 22,286,622.45 |
| වත්කම් අපහරණය | | (129,240.00) | - |
| ක්‍රමක්ෂය | | (27,256,269.29) | (29,680,469.03) |
| වසර සඳහා පාරිතෝෂික වියදම | | 4,035,786.25 | 4,189,026.42 |
| පොළී අදායම | | (39,735,171.85) | (38,386,231.28) |
| **මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය - කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම්** | | **123,242,556.51** | **127,846,101.52** |
| ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම් | | 85,648.62 | (1,255,511.17) |
| ලැබීම් - සේවක | | (2,520,777.00) | (4,064,023.00) |
| පොළී ආදායම | | (1,672,839.94) | 26,186,952.20 |
| ගෙවීම් | | 7,451,048.87 | 10,062,620.53 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | | 17,783,500.00 | (13,623,900.00) |
| වෙන්කිරීම් හා උපචිත වියදම් | | (68,575,235.72) | 77,683,055.94 |
| **මෙහෙයුම් වලින් ජනිත වූ මුදල්** | | **75,793,901.34** | **222,835,296.02** |
| පාරිතෝෂික අරමුදල් ගෙවීම් | | (307,360.00) | (1,631,278.00) |
| වත්කම් අපහරණයෙන් ලද මුදල් | | 129,240.00 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | **75,615,781.34** | **221,204,018.02** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (33,003,577.55) | (13,699,506.13) |
| පුස්තකාල පොත් අත්පත් කර ගැනීම | | (15,670,425.44) | |
| කාලීන තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත් සඳහා ශුද්ධ ආයෝජන | | (99,999.00) | (89,995.78) |
| පොළී ලැබීම් | | (4,263,410.93) | (3,577,679.56) |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | 39,735,171.85 | 38,386,231.28 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | **(13,302,241.07)** | **21,019,049.81** |
| **මුල්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් | | (100,000,000.00) | (300,000,000.00) |
| **වර්ෂය තුළ මුල්‍ය ක්‍රියාකාරීත්වය තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(100,000,000.00)** | **(300,000,000.00)** |
| **වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දැභි ශුද්ධ වෙනස** | | **(37,686,459.73)** | **(57,776,932.17)** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | | 491,688,853.64 | 549,465,785.81 |
| **වර්ෂ අවසාන මුදල් සහ මුදල් සමාන දෑ** | සටහන **9** | **454,002,393.91** | **491,688,853.64** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

1 **ඒකාබද්ධ තොරතුරු**

**1.1 වාර්තාකරන ආයතනය**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 1991 අංක 37 දරණ ජාගකොස පනත යටතේ ස්ථාපනය කොට ඇත. කොමිෂන් සභාවේ කාර්යාලය සහ ගණුදෙනු සිදුකරනු ලබන ප්‍රධාන මධ්‍යස්ථානය කොළඹ 05 , උද්‍යාන පාරේ අංක 241 දරන ස්ථානයෙහි පිහිටුවා ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍යමය දත්ත ඇතුලත් වේ

**1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය**

කොමිෂන් සභාවේ කාර්යය වනු ඇත්තේ ඔම්නි බස් මගින් මගී ජනතාවට ප්‍රවාහන සේවාවන් සැලසීම පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් ලබාදීම සහ ඔම්නි බස් සඳහා නිශ්චය කර ගනු ලබන ප්‍රදේශ සඳහා මගී ප්‍රවාහන සේවා බලපත්‍ර නිකුත් කිරීම වේ.

**1.3** 2018 වර්ෂය අවසානය වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ස්ථිර සේවක මණ්ඩලය 193 කි. එමෙන්ම කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 8 දෙනෙකු සේවය කර ඇත..

**1.4 වාර්තාකරන දිනය**

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ දිනය දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වේ.

**1.5 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය**

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය / සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධිකාරී බලය ලබා දී ඇත්තේ 2019.04.11 දිනය.

**2 වැදගත් ගිණුම්කරන පිළිවෙත්හි සාරාංශය**

**2.1 පිළියෙල කිරීමේ පදනම**

කොමිෂන් සභාවේ ගිණුම් පිළියෙල කරනු ලබන්නේ රාජ්‍ය අංශයේ ගිණුම් පිළිබඳ ප්‍රමිතීන් (SLPSASs) සහ පොදුවේ පිළිගනු ලබන ගිණුම්කරණ මූලධර්ම (LKAS 20) වලට අනුකූලවය. මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ගත්මිල මත පදනම්ව වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා රජයේ ගිණුම් පිළිවෙත් අනුව ඇස්තමේන්තු මත සකස් කර ඇත.
ඉහත සඳහන් ක්‍රියාවලි අනුව ආයතනයේ තොරතුරු, සටහන්, ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමේදී ගිණුම්කරණ ක්‍රියාවලියෙන් පරිබාහිර, විශේෂිත හා සංකීර්ණ වූ අවස්ථාවන් ගිණුම්කරණයට ලක් කිරීමේදී එම අවස්ථාවට යොදාගනු ලබන උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳව සටහන් අංක 3 මගින් දක්වා ඇත.

**2.2 ගිණුම් පිළිවෙත් වල වෙනස්කිරීම්**

පහත සඳහන් කර ඇති මූල්‍ය ප්‍රකාශන වල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන කාල සීමාව සඳහා ක්‍රමාණුකූලව සඳහන් කර ඇත.

පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සසඳමින් වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම අදාල තැන්හි සංශෝධනය කර ඇත.

**2.3 විදේශ විනිමය පරිවර්තනය**

**2.3.1 මෙහෙයුම් සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇති ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ ආයතනය මෙහෙය වනු ලබන ප්‍රාථමික ආර්ථික පරිසරය අනුවය. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

**2.3.2 ගණුදෙනු සහ ශේෂය**

විදේශ විනිමය ගණුදෙනු ක්‍රියාකාරකම් විනිමය ගණුදෙනු බවට පරිවර්තනය කරනුයේ ගණුදෙනු කරන දිනයේ පවත්නා විනිමය අනුපාතය මතය.

**2.4 දේපළ පිරියත උපකරන පිරිවැය**

දේපළ පිරියත උපකරන පිරිවැය යනු මිලදී ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීම සඳහා දරන ලද වියදම් වත්කම අපේක්ෂිත කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට දැරූ වියදම වේ .දේපළ පිරියත සහ යන්ත්‍ර උපකරණවල වටිනාකම දක්වන විටදී එය මිලදී ගැනීමට දැරූ මූලික වියදමින් මෙතෙක් ක්ෂයවීම් හා හානි අඩුකිරීමෙන් පසු ශුද්ධ වටිනාකම දක්වා ඇත.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......**

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීමේ, වැඩිදියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වියදම් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ තත්ත්වයට පත් කිරීම දක්වා ගිණුම් වත්කම් තීරණය ලෙස සළකා ඇත. වත්කම් වලට අදාල නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් වියදම් අදාල ආදායම් වියදම් ගිණුමට ලියාහැර ඇත.

ඉඩම් වටිනාකම ක්ෂයකිරීමට ලක් නොවන අතර අනෙකුත් වත්කම් ක්ෂයකිරීමට ලක් කිරීමේදී සරළ රේඛීය ක්ෂය ක්‍රමය යොදාගෙන ඇත. අදාල වත්කම් වල ආයුකාලය පහත පරිදි ගෙන ඇත.

| වත්කම් වර්ගය | අවුරුද්ද |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 05 තුල |
| ලී බඩු සහ සවිකිරීම් | වර්ෂ 10 තුළ |
| කාර්යාල උපකරණ | වර්ෂ 05 තුල |
| විවිධ උපකරණ | වර්ෂ 05 තුල |
| පරිගණක සහ මුද්‍රන යන්ත්‍ර | වර්ෂ 04 තුල |
| යන්ත්‍ර | වර්ෂ 05 තුල |
| ගොඩනැගිලි | වර්ෂ 20 තුල |
| විද්‍යුත් උපකරණ (LED) | වර්ෂ 03 තුල |

වත්කම් වල පොත් අගය එහි ඇස්තමේන්තුගත උපයා ගතහැකි අගයට වඩා වැඩි අගයක් ගන්නේ නම් එම වත්කම් වල පොත් අගය වහාම උපයාගත හැකි අගයට ලියාහරිනු ලැබේ.

**2.4.1 භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් මත කරන ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් සහ කාලීන තැන්පතු පිරිවැය අනුව සඳහන් කර ඇත.

**2.6 ලැබීම්**

ලැබීම් යනු ලබාගන්නා ලද සේවාවන් සඳහා ගෙවීමට ඇති මුදල් වේ. එකතුව සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී බලාපොරොත්තු වන අතර ලැබීම් වර්ගීකරණය කරනුයේ ජංගම වත්කම් ලෙසය. ලැබීම් හදුනාගැනීම සහ මනිනු ලබන්නේ ගණුදෙනු කරන කරන වටිනාකම /අගය මතය.

**2.7 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් හදුන්වා ඇත්තේ අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු , බැංකුවල ඇති ක්ෂණික /ස්ථාවර තැන්පතු සහ පාරිතෝෂික අරමුදල්ය

**2.8 ගෙවීම්**

ගෙවීම් යනු භාණ්ඩ හා සේවා සපයන්නන් ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා අවශ්‍යයෙන් කළයුතු ගෙවීම් වේ. ගෙවීම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් කාලචක්‍රයේ කළ යුතු ගෙවීමක් නම් එය ජංගම වත්කමක් ලෙස වර්ග කරනු ලැබේ. (වසර 1 ක් හෝ ඊට අඩු) එසේ නොමැති අවස්ථාවල ඒවා ජංගම නොවන වත්කම් ලෙස හදුන්වනු ලැබේ.

ගෙවීම් මූලික වශයෙන් හදුනාගනු ලබන්නේ ගණුදෙනු කරන මිලට අනුව වන අතර ඉන් පසුව ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී මෙම මිලට මිණුම් කරනු ලැබේ.

**2.9 රජයේ ප්‍රතිපාදන**

මූල්‍ය නොවන ප්‍රතිපාදන ඇතුලත්ව රජයෙන් ලැබෙන ප්‍රතිපාදන ඒවායෙහි සාධාරන වටිනාකම අනුව හදුනාගනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණ වලට අදාල රජයේ ප්‍රතිපාදන ජංගම නොවන වත්කම් වල රජයේ විලම්භිත ප්‍රතිපාදන යටතට ඇතුලත් කර ඇති අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී මෙය හදුනාගනු ලබන්නේ අදාල වත්කම් වල අපේක්ෂිත ආයු කාලයේ සරළ රේඛීය පදනම මතය.

මූල්‍ය නොවන ප්‍රතිපාදන මූල්‍ය නොවන වත්කමෙහි ධාරණ වටිනාකම අනුව ගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකම අනුව ප්‍රතිපාදන ලබාදීම සහ වත්කම් ගණනය කරනු ලැබේ.

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2.10 මිලදී ගැනීමේ පිරිවැය**

මුදල් කාර්යඵලය පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ මිලදී ගන්නා ලද කාලය තුලය.

**2.11 සේවක ප්‍රතිලාභ**

කොමිෂන් සභාවට නිශ්චිත ප්‍රතිලාභ සහ නිශ්චිත දායකත්වය පිළිබඳ සැළසුම් ඇත

**(a) නිශ්චිත දායකත්ව සැලැස්ම**

නිශ්චිත දායකත්ව සැළැස්මක් යනු කොමිෂන් සභාව මගින් ස්ථාවර දායකත්ව මුදලක් වෙනම අස්ථිත්වයක් වෙත ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි. මෙය පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මක් බැවින් තවදුරටත් ඒ සඳහා දායකත්ව මුදලක් ගෙවීම සඳහා කොමිෂන් සභාවට භෞතික හෝ අධ්‍යාත්මික බැඳීමක් නොමැත. කල් පිරුණු පසු මෙම දායකත්ව මුදල් සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන් හඳුන්වනු ලැබේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් එක් සේවකයෙකුගෙන් දළ පාරිශ්‍රමික මුදලක් ලෙස 15% ක් බැර කරනු ලබන අතර සේවා නියුක්ති භාරකාර අරමුදලට 3% දළ පාරිශ්‍රමිකයක් අය කරනු ලැබේ.

**(b) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

සේවකයාගේ සේවා පළමු වර්ෂයේ සිට සේවය කරනු ලබන සෑම වර්ෂයකම මාස ½ ක වේතනය සේවක පාරිතෝෂික අරමුදලට බැර කිරීමට කටයුතු යොදා ඇත. කෙසේ වෙතත් 1983 පාරිතොෂික අරමුදල ගෙවීමේ පනත් අංක 12 අනුව සේවකයෙකුට පාරිතෝෂික අරමුදලට හිමිකම් ලබාගත හැක්කේ වර්ෂ 05 අඛණ්ඩ සේවාවක් කිරීමෙනි.

**(c) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ**

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ පිළිබඳ වගකීම මනිනු ලබන්නේ සේවකයින් විසින් ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත වට්ටම් හෝ කරන ලද මුදලමය වටිනාකම මතය

**2.12 ප්‍රතිපාදන සහ අවිනිශ්චිත වගකීම්**

මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ අතීතයේ සිදුකරන ලද සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් කොමිෂන් සභාවට වර්තමානයේ ඇති නෛතික බැඳීම හෝ කොමිෂන් සභාවට අවශ්‍ය ආර්ථික සම්පත් පිටතට ගලායෑම සිදුවිය හැකි අතර විශ්වසනීය ලෙස එම ප්‍රමාණයන් ඇස්තමේන්තු ගත කල හැකිය.

පදනම් කරගෙන දැනට පවත්නා බැඳීමද වගකීම පියවීම / නිරවුල් කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම අනුව ප්‍රතිපාදන මනිනු ලැබේ.

සියලුම අස්ථාවර වගකීම් මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහනක් ලෙස එළිදරවූ නොකළහොත් සම්පත් පිටතට ගලායාමේ හැකියාව දුරස්ථ වනු ඇත.

**2.13 ආදායම හඳුනාගැනීම**

ආර්ථිත ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම ආයතනයට ගලා එන අවස්ථාවේදී ආදායම් වශයෙන් හඳුනාගැනීම. කොමිෂන් සභාව අදායම හඳුනාගනු ලබන්නේ ආදායම් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම මැනිය හැකි අවස්ථාව සහ ඉදිරියේදී කොමිෂන් සභාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි සම්භාවිතාව අනුවය.

කොමිෂන් සභාව විසින් ආදායම හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන නිර්ණායක හඳුනාගත හැක. ඒ ඒ ප්‍රධාන මාර්ග වල ආදායම මැනීම සඳහා ආදේශ කර ඇත.

(a) **බලපත්‍ර ආදායම**

මාර්ග බලපත්‍ර වලින් ලැබෙන අදායම හඳුනාගනු ලබන්නේ කොමිෂන් සභාව වෙත අනාගතයේ ආර්ථික ප්‍රතිලාභ සැලැස්මට ඇති හැකියාව මතය.

**(b) දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේදි ඇති ලාභ සහ අලාභ**

බැහැර කිරීමේදී ඇති ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ලත් මුදල් / උත්පාදන මුදල් ධාරන පිරිවැයත් සමඟ සන්සන්දනය කිරීමෙනි. මෙය මුදල් කාර්යඵල ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

**2.14 වියදම්**

මෙහෙයුම් කරන කාලසීමාවෙදී දරන ලද වියදම් යනු වාර්තාකරන කාලයේදී ලාභය ලෙස ලැබෙන ආදායමයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2.15 ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සිදුවීම්**

ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවන ද්‍රව්‍යමය සිදුවීම් සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය තැන්වල සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

**2.16 වගකීම්**

ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සියලුම ද්‍රව්‍යමය වගකීම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් කිරීම මඟින් අනාවරණය කර ඇත.

**3. වැදගත් ගිණුම්කරණ පිළිවෙත් (නිමාන) සහ විනිශ්චයන්**

මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වය මගින් විනිශ්චයන් ගණනාවක් යොදාගනු ලබන අතර වත්කම්, වගකීම්, ආදායම සහ වියදම හඳුනාගැනීම සහ මැනීම සඳහා තක්සේරු (නිමාන) සහ උපකල්පන රාශියක් උපයෝගී කරගනු ලබයි.

මැනීමට යන හඳුනාගැනීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන තක්සේරු /පළාත් සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දක්වා ඇති පරිදි වේ:

(a) **ක්ෂය වීගෙන යන වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය**

වත්කමේ අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත ශේෂ පත්‍ර දිනයට ක්ෂය වන වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තක්සේරු කරනු ලබන බව කළමණාකාරීත්වය සමාලෝචනයෙහි දක්වා ඇත. මෙම අස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයන්ට හේතුව ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණික උපාංග වල උපයෝගීතාවය වෙනස් කිරීමට ඉවහල් වන යල්පැන ගිය තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**4.** දේපළ පිරියත සහ උපකරණ

සින්නක්කර වත්කම් - පිරිවැය

| අංක | වත්කම් පංතිය | පිරිවැය | | | | ක්ෂය ප්‍රතිශතය | ක්ෂය කිරීම | | | | අංක | වත්කම් පංතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2018.01.01 දිනට ශේෂය | අපහරනය කිරීම | වසර තුළදී එකතුකිරීම් | 2018.12.31 දිනට ශේෂය | | 2018.01.01 දිනට ශේෂය | අපහරනය කිරීම | වසර තුළදී එකතුකිරීම් | 2018.12.31 දිනට ශේෂය | | |
| 1 | ඉඩම් | 245,000,000.00 | - | | 245,000,000.00 | - | - | - | - | - | 245,000,000.00 | 245,000,000.00 |
| 2 | ගොඩනැගිලි | 180,020,661.06 | - | 11,367,861.98 | 191,388,523.04 | 5% | 51,815,697.47 | - | 8,706,309.91 | 60,522,007.38 | 130,866,515.66 | 128,204,963.59 |
| 3 | මෝටර් වාහන | 75,547,270.00 | - | - | 75,547,270.00 | 20% | 64,209,249.10 | - | 2,250,000.00 | 66,459,249.10 | 9,088,020.90 | 11,338,020.90 |
| 4 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 34,619,853.10 | - | 753,218.95 | 35,373,072.05 | 10% | 17,419,964.88 | - | 3,070,259.17 | 20,490,224.05 | 14,882,848.00 | 17,199,888.22 |
| 5 | කාර්යාල උපකරණ | 14,756,092.44 | 1,213,783.28 | 10,448,894.22 | 23,991,203.38 | 20% | 11,684,908.33 | 1,213,783.28 | 696,602.46 | 11,167,727.51 | 12,823,475.87 | 3,071,184.11 |
| 6 | විවිධ උපකරණ | 6,290,860.97 | 1,428,788.57 | 3,525,927.40 | 8,387,999.80 | 20% | 4,147,163.49 | 1,428,788.57 | 619,628.78 | 3,338,003.70 | 5,049,996.10 | 2,143,697.48 |
| 7 | පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර | 54,922,473.39 | 5,299,487.30 | 6,907,675.00 | 56,530,661.09 | 25% | 36,106,043.61 | 5,299,487.30 | 5,697,098.69 | 36,503,655.00 | 20,027,006.09 | 18,816,429.78 |
| 8 | යන්ත්‍රෝපකරණ | 1,775,637.00 | | - | 1,775,637.00 | 20% | 1,772,186.60 | - | 2,990.00 | 1,775,176.60 | 460.40 | 3,450.40 |
| 9 | විද්‍යුත් ප්‍රදර්ශන නාමපුවරු | 62,415,360.00 | - | | 62,415,360.00 | 33.33 % | 62,415,360.00 | - | - | 62,415,360.00 | - | - |
| එකතුව | | **670,031,277.33** | **7,942,059.15** | **33,003,577.55** | **695,092,795.73** | | **249,422,719.11** | **7,942,059.15** | **21,042,889.01** | **262,671,403.34** | **437,738,323.02** | **425,777,634.48** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ).

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

*(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | | 2018 | 2017 |
|---|---|---|---|---|
| 5 | **ලැබියයුතු, තැන්පතු සහ අත්තිකාරම්** | | | |
| | ලැබියයුතු | සටහන 5.1 | 2,020,007.50 | 1,659,302.50 |
| | තැන්පතු සහ අත්තිකාරම් | සටහන 5.2 | 1,753,476.81 | 2,199,830.43 |
| | | | **3,773,484.31** | **3,859,132.93** |
| | **5.1 ලැබියයුතු** | | | |
| | ලැබිය යුතු ආදායම් | | 2,020,007.50 | 1,659,302.50 |
| | | | **2,020,007.50** | **1,659,302.50** |
| | **5.2 තැන්පතු සහ අත්තිකාරම්** | | | |
| | තැන්පතු | | 686,500.00 | 686,500.00 |
| | අත්තිකාරම් - ව්‍යාපෘති | | 2,457.00 | 228,726.75 |
| | අත්තිකාරම් - ජාගකොස | | 37,084.40 | 477,911.02 |
| | අත්තිකාරම් ගෙවීම් | | 1,027,435.41 | 806,692.66 |
| | | | **1,753,476.81** | **2,199,830.43** |
| 6 | **ලැබියයුතු - සේවක** | | | |
| | ආපදා ණය | | 21,422,735.00 | 18,366,180.00 |
| | ආපදා ණය | | 786,840.00 | 1,274,118.00 |
| | රෙදිපිළි සඳහා අත්තිකාරම් | | 410,200.00 | 426,200.00 |
| | උත්සව අත්තිකාරම් | | 243,000.00 | 275,500.00 |
| | | | **22,862,775.00** | **20,341,998.00** |
| 7 | **ආයෝජන කාලීන - තැන්පතු** | | | |
| | කාලීන තැන්පතු | | 34,890,548.09 | 31,724,072.16 |
| | | | **34,890,548.09** | **31,724,072.16** |

පාරිතෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.33,970,548.09 (2017- 30,804,072

| | | | 2018 | 2017 |
|---|---|---|---|---|
| 8 | **ආයෝජන භාණ්ඩාගාර - බිල්පත්** | | | |
| | භාණ්ඩාගාර බිල්පත් | | 12,707,047.00 | 11,610,112.00 |
| | | | **12,707,047.00** | **11,610,112.00** |

පාරිතෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු.12,707,047.00 (2017-11,610,112.

| | | | 2018 | 2017 |
|---|---|---|---|---|
| 9 | **මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| | මුදල් -අතැති | සටහන 9.1 | 634,775.00 | 384,192.00 |
| | මුදල් - බැංකු | සටහන 9.2 | 601,517.21 | 289,321.65 |
| | කෙටිකාලීන තැන්පතු | සටහන 9.3 | 452,766,101.70 | 491,015,339.99 |
| | **මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් හා මුදල් සමාන දෑ** | | **454,002,393.91** | **491,688,853.64** |
| | **9.1 මුදල්- අතැති** | | | |
| | අතැති මුදල් | | 559,775.00 | 309,192.00 |
| | සුළු මුදල් අග්‍රිමය | | 75,000.00 | 75,000.00 |
| | | | **634,775.00** | **384,192.00** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......**

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

*(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | 2018 | 2017 |
|---|---|---|---|
| **9.2** මුදල් - බැංකු | | | |
| මහජන බැංකුව -නාරාහේන්පිට | | 545,472.43 | 289,321.65 |
| මහජන බැංකුව -නාරාහේන්පිට ( ආසන වෙන් කිරීම්) | | 56,044.78 | |
| | | **601,517.21** | **289,321.65** |
| **9.3** කෙටි කාලීන තැන්පතු | | | |
| කෙටි කාලීන ආයෝජන සහ කැඳවුම් තැන්පතු | | 56,016,723.37 | 55,976,778.67 |
| ආයෝජන- රෙපෝ | | 396,495,685.71 | 434,845,956.74 |
| ඉතිරිකිරීමේ ගිණුම - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | 253,692.62 | 192,604.58 |
| | | **452,766,101.70** | **491,015,339.99** |

පාරිතෝෂික වගකීම සඳහා වෙනම පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු මුදල රු.253,692.62 (2017-192,604.58) .

| | | 2018 | 2017 |
|---|---|---|---|
| **10** | **රජයේ ප්‍රදාන** | | |
| | **ජනවාරි 01දිනට ශේෂය** | 322,307,201.26 | 351,987,670.29 |
| | වසර තුළ ප්‍රදාන ලැබීම් | - | - |
| | රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | (27,256,269.29) | (29,680,469.03) |
| | **දෙසැම්බර් 31ට ශේෂය** | **295,050,931.97** | **322,307,201.26** |

අංක.241 උද්‍යාන පාර, නාරාහේන්පිට පිහිටි ඉඩම ශ්‍රී ලංකා රජයෙන් ලද මූල්‍ය නොවන රජයේ ප්‍රදානයක් ලෙස හඳුනාගෙන ප්‍රදානය ලද අවස්ථාවේ වෙළඳපොල අගයට වත්කම් සටහන් කරගන්නා ලද අතර ගොඩනැගිලිවල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමක්ෂය කරන ලදී.

| | | 2018 | 2017 |
|---|---|---|---|
| **11** | **ගෙවියයුතු විශ්‍රාමික ප්‍රතිලාභ** | | |
| | **ජනවාරි 01 දිනට ශේෂය** | 37,088,716.75 | 34,530,968.33 |
| | වසර තුළ හඳුනාගත් වියදම් | 4,035,786.25 | 4,189,026.42 |
| | වසර තුළ කරන ලද ගෙවීම් | (307,360.00) | (1,631,278.00) |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **40,817,143.00** | **37,088,716.75** |

| | | 2018 | 2017 |
|---|---|---|---|
| **12** | **ගෙවිය යුතු** | | |
| | කුලියට ගැනීම් | 44,293.79 | 44,293.79 |
| | මුද්දර ගාස්තු | 15,275.00 | 14,375.00 |
| | උපයන විට ගෙවීමේ බදු | 50,400.00 | 26,400.00 |
| | විවිධ ණයහිමියෝ | 8,138,632.11 | 996,141.96 |
| | ආදායම් කලට පෙර ලැබීම් | 44,632,492.73 | 53,835,319.23 |
| | වෙනත් ගෙවියයුතු | 651,145.19 | 623,126.19 |
| | EPF ගෙවිය යුතු | 26,234.50 | 1,066.00 |
| | බැංකු ණය සහ තැන්පතු | 23,600.00 | - |
| | ආසන වෙන් කිරීම සඳහා ගෙවියයුතු | 29,634.78 | - |
| | ලංසු රක්ෂණ ඉල්ලීම් | 4,896,212.70 | - |
| | කාර්යසාධන සුරක්ෂණ | 2,438,700.00 | - |
| | තිරසර පාසල් ව්‍යාපෘතිය | 761,790.00 | - |
| | BIA ගේට්වේ ව්‍යාපෘතිය | 1,283,360.24 | - |
| | | **62,991,771.04** | **55,540,722.17** |

**ලංසු සුරක්ෂණ ඉල්ලීම් රු. 4,896,212.70 හා කාර්යසාධන ඉල්ලීම් රු. 2,438,700.00**

මෙම ලංසු සුරක්ෂණ හා කාර්යසාධන ඉල්ලීම් වල අඩක් නිම කරනලද කිලිනොච්චි බස් පර්යන්තයට අදාලව ධර්මදාස කන්ස්ට්‍රක්ෂන් සමාගමෙන් ලැබිය යුතු මුදල් වේ. කොන්ත්‍රාත්කරු අසනීප තත්ත්වයෙන් පසුවන අතර ජාගකොස විසින් මෙම බස් පර්යන්තය උතුරු පළාතේ රජයේ ආයතනයක් වෙත පැවරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් උපදෙස් ලබා දී ඇත.

| | | | 2018 | 2017 |
|---|---|---|---|---|
| **13** | **වෙන් කිරීම් සහ උපචිත වියදම්** | | | |
| | උපචිත වියදම් - ව්‍යාපෘති | සටහන **13.1** | 19,297,412.27 | 89,443,772.91 |
| | උපචිත වියදම් - පුනරාවර්තන | සටහන **13.2** | 16,163,163.16 | 15,097,138.24 |
| | විගණන ගාස්තු වෙන් කිරීම් | | 1,908,926.00 | 1,403,826.00 |
| | | | **37,369,501.43** | **105,944,737.15** |

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට......**

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

(ශ්‍රී ලංකා රුපියල් වලින්)

| 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 2018 | 2017 |
|---|---|---|
| **13.1 උපචිත වියදම් - ව්‍යාපෘති** | | |
| **පුනරාවර්තන** | | |
| සමාජයීය සුභසාධන බස් සේවා සඳහා දායකත්වය | 58,850.00 | 73,406,171.00 |
| පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ | 1,000.00 | 127,070.00 |
| ගුණාත්මය හා ගාස්තු නියාමනය | 10,673,106.54 | 765,066.63 |
| ජාගකොස /පළාත් ප්‍රවාහන අධිකාරි ඇතුළු ප්‍රවාහනයට සෘජුව සම්බන්ධ ආයතනවල නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් | 77,550.00 | |
| ප්‍රවාහනය ආශ්‍රිත පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 2,800.00 | 427,299.94 |
| තිරසර පාසල් ව්‍යාපෘතිය | 4,100.00 | |
| BIA ගේට්වේ ව්‍යාපෘතිය | 94,000.00 | |
| | **10,911,406.54** | **74,725,607.57** |
| **ප්‍රාග්ධන** | | |
| පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ | 6,313,740.32 | 14,155,726.26 |
| ආයතනික ධාරිතාව නැංවීම සහ නියාමන ධාරිතාව සහතික වීමට නව ප්‍රතිසංස්කරණ සහ යටිතල පහසුකම් සංවර්ධනය | 2,072,265.41 | 562,439.08 |
| | **8,386,005.73** | **14,718,165.34** |
| | **19,297,412.27** | **89,443,772.91** |

| **13.2 උපචිත වියදම් - පුනරාවර්තන** | 2018 | 2017 |
|---|---|---|
| ගැලපුම් දීමනාව | - | 83,703.00 |
| පිරිසිදු කිරීමේ සේවා | 1,102,566.64 | 711,014.55 |
| සන්නිවේදන | 262,086.58 | 237,198.09 |
| ජීවන වියදම් දීමනාව | - | 96,544.00 |
| විදුලිය සහ බලය | 700,813.09 | 626,254.58 |
| සේවක සුභසාධන | 3,084,587.80 | 175,868.00 |
| සේවක වෛද්‍යාධාර ක්‍රමය | 15,000.00 | 34,173.34 |
| EPF | 39,351.75 | 1,600.00 |
| ETF | 7,870.35 | 320.00 |
| ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 6,382,299.97 | 6,261,216.52 |
| ඉන්ධන සහ ලිහිසි | 376,563.35 | 338,599.68 |
| නිවාඩු දින දීමනා -විධායක | 53,485.00 | - |
| භාෂා දීමනා | 78.00 | - |
| නීති ගාස්තු | 69,885.00 | 29,500.00 |
| ගමන් වියදම් - දේශීය | 46,550.00 | 118,447.50 |
| ගොඩනැගිලි නඩත්තු | | 40,260.00 |
| කාර්යාල උපකරණ නඩත්තු | 6,126.74 | 57,430.73 |
| වෘත්තීය ආයතන සාමාජික ගාස්තු | 8,500.00 | - |
| රැස්වීම් සඳහා ආහාරපාන | 100.00 | 6,822.00 |
| පුවත්පත් සහ සඟරා | 21,360.00 | 9,500.00 |
| කාර්යාලයීය අවශ්‍යතා | 81,940.00 | 3,150.00 |
| විවිධ වියදම් | 205,000.00 | |
| අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන | 1,132,977.00 | 23,046.00 |
| පුවත්පත් හා වාර සඟරා | 207,000.00 | - |
| මෝටර්රථ අළුත්වැඩියා සහ නඩත්තු | 32,651.00 | 1,004,215.71 |
| වරිපනම් | - | 36,036.00 |
| වැටුප් හා වේතන | 235,910.50 | 289,571.00 |
| ආරක්ෂක සේවා | 1,454,608.48 | 4,576,877.04 |
| කාර්ය මණ්ඩල පුහුණු | 44,500.00 | - |
| ප්‍රවාහන සහ කුලී ගාස්තු | 536,728.00 | 238,832.00 |
| ජලය | 52,123.91 | 77,958.50 |
| ලදුපත් මත මුද්දර ගාස්තු | 2,500.00 | 19,000.00 |
| | **16,163,163.16** | **15,097,138.24** |

**වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ.**

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

( ශ්‍රී ලංකා රුපියල් වලින් )

| 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | 2018 | 2017 |
|---|---|---|---|
| 14 | ආදායම් | | |
| | **14.1** බලපත්‍ර ආදායම් | | |
| | මාර්ග බලපත්‍ර ආදායම | 262,132.96 | 160,500.00 |
| | බලපත්‍ර අළුත්කිරීමේ ආදායම | 21,344,886.00 | 21,256,912.00 |
| | මාර්ග ටෙන්ඩර් ආදායම | 317,046,545.29 | 352,778,497.73 |
| | | **338,653,564.25** | **374,195,909.73** |
| | **14.2** වෙනත් ආදායම් | | |
| | පරිපාලන ආදායම් | 39,012,160.00 | 32,744,465.00 |
| | බැස්ටියන් මාවත වැසිකිලි ආදායම | 8,618,860.25 | 7,598,552.50 |
| | විවිධ ආදායම් | 32,394,774.60 | 20,285,823.85 |
| | | **80,025,794.85** | **60,628,841.35** |
| | මුළු ආදායම | **418,679,359.10** | **434,824,751.08** |
| 15 | වෙනත් ආදායම් | | |
| | **15.1** පොළී ආදායම | | |
| | තැන්පතු මත පොළිය | 38,732,131.85 | 37,676,271.28 |
| | ආපදාණය පොළිය | 1,003,040.00 | 709,960.00 |
| | | **39,735,171.85** | **38,386,231.28** |
| | **15.2** වෙනත් | | |
| | රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය | 27,256,269.29 | 29,680,469.03 |
| | | **27,256,269.29** | **29,680,469.03** |
| | | **66,991,441.14** | **68,066,700.31** |
| 16 | මෙහෙයුම් වියදම් | | |
| | **16.1** සේවක මණ්ඩල වියදම් | | |
| | වැටුප් හා වේතන | 78,469,325.88 | 71,722,903.98 |
| | ජීවන වියදම් දීමනාව | 18,090,840.00 | 17,414,506.00 |
| | වෘතීය දීමනා | 749,023.00 | 186,000.00 |
| | භාෂා දීමනාව | 258,347.72 | 208,054.00 |
| | සේවක අර්ථසාධක අරමුදල් | 13,502,125.28 | 12,405,625.29 |
| | සේවක භාරකාර අරමුදල | 2,700,425.05 | 2,481,125.06 |
| | නිවාඩු දින දීමනා -විධායක | 568,745.00 | 578,517.00 |
| | අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන | 10,959,065.78 | 6,005,266.00 |
| | පාවිච්චියට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 6,418,459.97 | 6,591,717.28 |
| | පාරිතෝෂික | 4,035,786.25 | 4,189,026.42 |
| | ප්‍රසාද දීමනා | 2,754,250.00 | 2,681,250.00 |
| | | **138,506,393.93** | **124,463,991.03** |
| | **16.2** ප්‍රවාහන | | |
| | මෝටර්රථ අළුත්වැඩියා සහ නඩත්තු | 5,761,137.22 | 4,879,077.08 |
| | ඉන්ධන සහ ලිහිසි | 4,748,096.52 | 3,504,857.99 |
| | ප්‍රවාහන සහ කුලී ගාස්තු | 7,638,169.04 | 1,055,658.67 |
| | බලපත්‍ර සහ රක්ෂණ | 1,335,172.00 | 1,215,899.50 |
| | | **19,482,574.78** | **10,655,493.24** |
| | **16.3** ගමන් වියදම් හා යැපීම් දීමනා | | |
| | විදේශ ගමන් වියදම් | 931,524.00 | 15,850.00 |
| | දේශීය ගමන් වියදම් | 3,495,475.95 | 2,370,150.94 |
| | | **4,426,999.95** | **2,386,000.94** |

**Figures in brackets indicates deductions.**
**Notes to the Financial Statements Continued**

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව** *(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 2018 | 2017 |
|---|---|---|
| **16.4 සේවා ස්ථාන වියදම්** | | |
| කාර්යාලයීය අවශ්‍යතා (ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ) | 4,865,093.51 | 5,411,484.05 |
| පිරිසිදු කිරීම | 10,491,432.71 | 8,160,568.64 |
| වරිපනම් හා බදු | 288,288.00 | 348,481.00 |
| ආරක්ෂක සේවා | 17,968,132.22 | 16,531,050.44 |
| විදුලිය සහ බලය | 8,546,462.23 | 7,911,330.91 |
| ජලය | 658,553.34 | 587,790.68 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 840,400.00 | 1,144,700.00 |
| රැස්වීම් සඳහා ආහාරපාන | 437,157.42 | 387,723.44 |
| මාර්ගස්ථ මුදල් රක්ෂණය | 60,638.20 | 67,977.91 |
| සන්නිවේදන | 3,404,388.21 | 2,906,670.01 |
| | **47,560,545.84** | **43,457,777.08** |
| **16.5 ස්ථාවර වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු** | | |
| ගොඩනැගිලි අළුත්වැඩියාව | 684,349.33 | 1,585,130.46 |
| කාර්යාලයීය උපකරණ අළුත්වැඩියාව | 1,341,979.27 | 1,897,995.27 |
| පරිගණක සහ උපාංග අළුත්වැඩියාව | 129,738.69 | 210,197.89 |
| | **2,156,067.29** | **3,693,323.62** |
| **16.6 සේවක සුභසාධනය** | | |
| සේවක වෛද්‍යාධාර ක්‍රමය | 950,275.00 | 2,317,755.81 |
| සේවක සුභසාධනය | 7,895,204.13 | 5,719,340.83 |
| නිල ඇඳුම් | 913,799.80 | 909,369.83 |
| | **9,759,278.93** | **8,946,466.47** |
| **16.7 සේවක සංවර්ධනය** | | |
| සේවක පුහුණු කිරීම් | 2,525,546.73 | 777,312.78 |
| වෘත්තීය ආයතන සාමාජික ගාස්තු | 238,802.84 | 210,740.27 |
| | **2,764,349.57** | **988,053.05** |
| **16.8 නීති ගාස්තු සහ වෙනත්** | | |
| විගණන ගාස්තු | 650,000.00 | 200,000.00 |
| නීති ගාස්තු | 800,647.50 | 611,284.50 |
| | **1,450,647.50** | **811,284.50** |
| **16.9 තොරතුරු** | | |
| පුවත්පත් දැන්වීම් | 2,426,384.75 | 2,097,657.50 |
| පුවත්පත් සහ සඟරා | 196,157.50 | 104,340.00 |
| | **2,622,542.25** | **2,201,997.50** |
| **16.10 ක්ෂය** | | |
| ගොඩනැගිලි | 8,706,309.91 | 8,586,578.57 |
| මෝටර් වාහන | 2,250,000.00 | 4,230,700.00 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 3,070,259.17 | 3,034,064.27 |
| කාර්යාලයීය උපකරණ | 696,602.46 | 403,148.42 |
| විවිධ උපකරණ | 619,628.78 | 593,084.98 |
| පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 5,697,098.69 | 5,436,056.21 |
| යන්ත්‍රෝපකරණ | 2,990.00 | 2,990.00 |
| | **21,042,889.01** | **22,286,622.45** |
| **16.11 මූල්‍ය ගාස්තු** | | |
| බැංකු ගාස්තු | 47,178.38 | 61,302.42 |
| | **47,178.38** | **61,302.42** |

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව** *(ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | | 2018 | 2017 |
|---|---|---|---|
| | **16.12 වෙනත් වියදම්** | | |
| | විවිධ වියදම් | 536,382.50 | 235,497.44 |
| | ලදුපත් සඳහා මුද්දර ගාස්තු | 47,375.00 | 77,150.00 |
| | | **583,757.50** | **312,647.44** |
| **17** | **මෙහෙයුම් නොවන ආදායම්** | | |
| | අපහරණය කළ වත්කම් | 129,240.00 | - |
| | | **129,240.00** | **-** |
| **18** | **ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන** | | |
| | ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන- පුනරාවර්තන | 400,000,000.00 | 393,100,000.00 |
| | ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන- ප්‍රාග්ධන | | 69,000,000.00 |
| | | **400,000,000.00** | **462,100,000.00** |
| **19** | **19.1 රජයේ ප්‍රදාන මත විශේෂ ව්‍යාපෘති වියදම්** | | |
| | ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන | 400,000,000.00 | 393,100,000.00 |
| | ව්‍යාපෘති වියදම් -ප්‍රාග්ධන | - | 68,047,139.71 |
| | | **400,000,000.00** | **461,147,139.71** |
| | **19.2 ජාගකොස අරමුදල් මත විශේෂ ව්‍යාපෘති වියදම්** | | |
| | ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන | 29,992,053.00 | 112,868,478.80 |
| | ව්‍යාපෘති වියදම් -ප්‍රාග්ධන | 39,954,199.92 | 1,273,720.18 |
| | | **69,946,252.92** | **114,142,198.98** |

## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ශ්‍රී ලංකා රාජ්‍ය ගිනුම්කරණ ප්‍රමිත අංක 3 අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු හා වැරදීම් සඳහා කරන ලද ගැලපීම් පහත පරිදි වේ.

1. ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අයත් ආදායම භාවිතා කරමින් මිලදී ගන්නා ලද රු. 4,589,099.00ක ස්ථාවර වත්කම් රාජ්‍ය ප්‍රදාන ගිණුම හර කිරීම හා රාජ්‍ය ප්‍රදාන (ව්‍යාපෘති - ප්‍රාග්ධන)ගිණුම බැර කිරීම මගින් එම අගය රාජ්‍ය ප්‍රදාන ගිණුමෙන් ඉවත් කිරීම.
2. ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අයත් ආදායම භාවිතා කරමින් මිලදී ගන්නා ලද රු. 4,589,099.00ක ස්ථාවර වත්කමට අදාල ක්‍රමක්ෂය අගය වන රු. 568,248.91ක අගය රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය ගිණුම හර කිරීමෙන් හා රාජ්‍ය ප්‍රදාන ගිණුම බැර කිරීමෙන් එම අගය ඉවත් කිරීම.
3. රු. 5,316,930.63ක ස්ථාවර වත්කම් ඉඩම් හා ගොඩනැගිලි ගිණුම හර කිරීම හා රු. 4,672,201.37ක වටිනාකම ආයතනික ධාරිතා සංවර්ධන ව්‍යාපෘති ගිණුම බැර කිරීම. ශේෂය වන රු. 644,729.26 ක අගය රඳවා තබා ගැනීම් ලෙස හඳුනා ගැනීම හා එය විවිධ ණයහිමි ගිණුම බැර කිරීම.
4. රු. 1955.00 හා රු. 391.00ක අගයයන් අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල් දායක මුදල් ලෙස හඳුනාගන්නා ලද අතර එම ගිණුම් බැර කර තිබීම නිවැරදි කිරීම සඳහා අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල් දායක මුදල් ගෙවිය යුතු ගිණුම හර කිරීම
5. රු. 5,316,930.63ක ගොඩනැගිලි පිරිවැයට අදාල රු. 147,854.37ක ක්ෂය අගය ශ්‍රී ලංකා රාජ්‍ය ගිනුම්කරණ ප්‍රමිත 7 අනුව හඳුනා ගැනීම

2017 මූල්‍ය ප්‍රකාශන වලට අදාලව ඉහත කරන ලද ගැලපීම් මත 2017 වර්ෂයේ ශුද්ධ අතිරික්තය / ඌනතාවය රු.160,889,609.87 සිට රු.169,437,152.96 දක්වා ඉහළ යන ලදී.

මෙම ගැලපීම් වල ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත අතිරික්තය / ඌණතාවය රු.410,467,930.63 සිට රු.419,015,473.72 දක්වා ඉහළ යන ලදී.

**වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. සීටීසී/ඒ/එන්ටීසී/එෆ්ඒ/01/2018/09
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2019 ජූලි 12 දින

PLANNING DEPARTMENT
31 JUL 2019
No.
NATIONAL TRANSPORT COMMISSION

සභාපති

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

PLANNING DEPARTMENT
31 JUL 2019
No.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

කිලිනොච්චි බස් නැවතුම්පල ඉදිකිරීම සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත් ගිවිසුම් උල්ලංඝනය කිරීම නිසා ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අවසන් කරගෙන ගෙවීම් අත්හිටුවා කොමිෂන් සභාව විසින් රු.4,869,212 ක් වූ ලංසු සුරක්ෂණය හා රු.2,438,700 ක් වූ කාර්යසාධන සුරක්ෂණය අයකරගෙන තිබුණි. එම මුදල කෙරීගෙන යන වැඩ වටිනාකමින් අඩු නොකර කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු ශේෂය සහ කෙරීගෙන යන වැඩ වටිනාකම වූ රු.7,334,912 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන සහතිකවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

* වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යුක්ත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

* අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

PLANNING DEPARTMENT
31 JUL 2019
NATIONAL TRANSPORT COMMISSION

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

* භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

* සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ ආදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර. එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

* හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය, ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 02. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

* 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව , මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

PLANNING DEPARTMENT
31 JUL 2019
NATIONAL TRANSPORT COMMISSION

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- * 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවේ.

- * 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත සහ ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාහාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික සත්ත්වයන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| <u>නීතිරීති / විධානයට යොමුව</u> | විස්තරය |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 (5) වගන්තිය | කොමිෂන් සභාවේ සෑම වර්ෂයක් අවසානයේදීම ඇති වන ශුද්ධ අතිරික්ත ආදායමෙන් ඉතිරි සියළුම මුදල් ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතු වුවද, 2018 වර්ෂයේ රු.165,284,562ක අතිරික්තයක් ඇති වී තිබුණද, රු.100,000,000 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. |
| (ii) පනතේ 11 වෙනි වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ දී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ආයතනය විසින් ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට රු.6,780,452 ක ශේෂයක් විය. |

PLANNING DEPARTMENT
31 JUL 2019
INP.
NATIONAL TRANSPORT COMMISSION

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| (ආ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත 08 වගන්තිය | කොමිෂන් සභාව විසින් මඟී ඉල්ලුම් හඳුනාගැනීම මත මාර්ග සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සිදු කළ යුතු වුවද, අධිවේගී මාර්ගයට අදාලව එවැනි සමීක්ෂණ සිදුකර තිබුණු අතර, කඩවතින් ගමන් ආරම්භකර තංගල්ල, හක්මන, කතරගම, දෙනියාය හා ඇඹිලිපිටිය මාර්ග සඳහා බස්රථ යෙදවිය යුතු බව හඳුනාගෙන තිබුණද, බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිරීක්ෂණය හැර කොමිෂන් සභාවේ බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  ආදායම් රැස් කිරීම කොමිෂන් සභාව පිහිටුවිමේ පනතේ සඳහන් අරමුණක් නොවූවද, අන්තර් පළාත් පෞද්ගලික බස් රථ සඳහා ආසන වෙන්කිරීමෙන් වර්ෂය තුළදී කොමිෂන් සභාව ආදායම් රැස්කර තිබුණි. එම කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් රු.1,428,548 ක් වූ වියදමක් දරා තිබුණද මේ සම්බන්ධයෙන් මඟී ජනතාව දැනුවත් වී නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  කොමිෂන් සභාව පෞද්ගලික සමාගමක් සමඟ 2017 සැප්තැම්බර් 29 දින PAS (Process Automation System) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. 31,735,051ක් වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණු අතර, ව්‍යාපෘතියෙහි සියලු වැඩ අවසන් කර 2018 නොවැම්බර් 15 දින කොමිෂන් සභාව වෙත භාරදීමට නියමිතව තිබුණද, 2019 මැයි 30 දින වන විටද, ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘතියෙහි කාර්යසාධන ප්‍රගතිය පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොවූ අතර 2018 දෙසැම්බර් 31 දින වනවිට මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 35ක ප්‍රමාණයක් විය.

PLANNING DEPARTMENT
31 JUL 2019
No.
NATIONAL TRANSPORT COMMISSION

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සිසු සැරිය ව්‍යාපෘති සඳහා සිසුන් හා පාසල් විසින් ඇල්ලීම් 31 ක් ඉදිරිපත් කර තිබුණද, 2018 වර්ෂයේදී එම ඇල්ලීම් 31ම ඉටු කිරීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ව්‍යාපෘති ඉටු කිරීමේදී ප්‍රවාහනය නියාමනය සිදුකරන ආයතනය ලෙස අදාල සේවාවන් සඳහා බස් යෙදවීම් සඳහා යොමු කිරීම කොමිෂමේ මූලික කාර්යක් මෙන්ම සමාජ වගකීමක් වන අතර ඒ ගැන සලකා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2005 ඔක්තෝම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ටෙන්ඩර් කිරීම මත නිත්‍ය සේවා බලපත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට අනුමැතිය ලැබී තිබුණද, එසේ ලංසු කැඳවීමකින් තොරව කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මාර්ග බලපත්‍ර 3440 ක් නිකුත් කර තිබුණු අතර, ඉන් සියයට 64ක් වාර්ෂික අලුත් කිරීමේ ගාස්තු වන රු.3,000ක ගාස්තු අයකිරීම මත හා සියයට 27ක් වාර්ෂිකව රු.15000 ගාස්තු අයකිරීම මත පමණක් ලබා දී තිබුණි. ඒ අනුව නිකුත් කරන ලද මුළු බලපත්‍ර වලින් සියයට 91ක් ටෙන්ඩර් කිරීමෙන් තොරව ලබාදීම නිසා කොමිෂන් සභාවට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. එසේම කොමිෂන් සභාව අධිවේගී මාර්ගයේ බස්රථ සඳහා තාවකාලික මාර්ග සේවා අවසර පත්‍ර අවම තාක්ෂණික අගය පදනම් කරගෙන ලබාදී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී උපරිම දින 28ක කාලයක් සඳහා බලපත්‍ර 820. ක් නිකුත් කර තිබුණු අතර, ටෙන්ඩර් කිරීම මඟින් ලබාගත හැකි උපරිම ආදායම අහිමි වී තිබුණි.

(ඇ) පනතේ 25 වන වගන්තිය අනුව වසරකට වැඩි කාලයක් සඳහා මාර්ග සේවා අවසරපත්‍ර ලබාදිය හැකි වුවද, කොමිෂන් සභාව විසින් විශාල මගී ඉල්ලුම සහිත අවස්ථාවල නිසි අනුමැතියකින් තොරව මාර්ග සේවා අවසරපත්‍ර හිමියන් වෙත දෛනික ගාස්තු අයකිරීම යටතේ අධිවේගී මාර්ගය සඳහා මාර්ග බලපත්‍ර 7740 ක්ද, සාමාන්‍ය මාර්ග සඳහා මාර්ග බලපත්‍ර 130ක්ද, නිකුත් කර තිබුණි.

(ඈ) දකුණු පළාත් මාර්ගයට මගී ප්‍රවාහන අධිකාරිය වෙත ගාස්තු ගෙවීමේ පදනම මත තාවකාලික මාර්ග සේවා අවසරපත්‍ර නිකුත් කිරීමට පැවරුම් සිදු කර තිබුණද , 2018 වර්ෂයේදී නිකුත් කරන ලද බලපත්‍ර 25 ඇතුලත් වූ පොත් 09 ක ආදායම් හා වියදම සහිත වූ අවසර පත්‍ර පොත් කොමිෂන් සභාව වෙත නැවත ලබාදී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

PLANNING DEPARTMENT
31 JUL 2019
No.
NATIONAL TRANSPORT COMMISSION

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(අ) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය යන සේවාවන් සඳහා බස්රථ සංඛ්‍යාව පිළිවෙලින් 100,15 හා 100 බැගින් වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණද, ඉන් ළඟා කර ගත් ඉලක්ක ප්‍රතිශතයන් මෙලෙස පිළිවෙලින් සියයට 57,27 හා 23 ක් විය.

(ආ) බැස්රියන් මාවතේ වැසිකිළි පද්ධති සඳහා වූ ආදායම් ලැබීම් පිළිබඳ පරීක්ෂාවේදී එම ලැබීම්වල ප්‍රමාද වීම් නිරීක්ෂණය විය. මෙම ප්‍රමාද වීම් දින 53 සිට දින 159 දක්වා පරාසයක පැවතුණි. ඒ අනුව ගිවිසුමෙහි 2 වන කොන්දේසිය උල්ලංඝනය කර ඇති අතර, 2011 පෙබරවාරි 24 දිනැති ගිවිසුමෙහි 2 වන වගන්තිය අනුව මාස 3ක කාලයක් ගෙවීම් පැහැර හැරිය හොත් ගිවිසුම අහෝසි වීමට හේතුවක් වන බව සඳහන් වුවද, ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේදී ලංකාවේ විවිධ පළාත්වල සිට උතුරු, නැගෙනහිර දක්වා මගී සේවා අවසරපත්‍ර නොමැතිව ධාවනය කරනු ලබන බස්රථ 28ක් පමණ ජංගම පරීක්ෂණ අංශය විසින් හඳුනාගෙන තිබුණු අතර, ඒ අනුව මාර්ග 17 ක් සඳහා මගී සේවා අවසර පත්‍ර 31 ක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. එහෙත් කොමිෂම විසින් මාර්ග 06ක් සඳහා මගී සේවා අවසර පත්‍ර 09ක් නිකුත් කිරීමට මිල ගණන් කැඳවා සාර්ථක ඉල්ලුම්කරුවන් තෝරාගෙන තිබුණද තෝරාගත් ඉල්ලුම්කරුවන් සඳහා අවසර පත්‍ර ප්‍රදානය සඳහා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම නිසා අනුමැතිය ලබාගැනීමට නොහැකි වී තිබුණි. එම හේතුවෙන් කොමිෂමට වසරකට රු.25,815,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

PLANNING DEPARTMENT
31 JUL 2019
No.
NATIONAL TRANSPORT COMMISSION

**ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

**නීති රීති / විධානයට යොමුව**

**(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ**

**(i) 10 (5) වගන්තිය**

2017 වර්ෂයේදී රු. මිලියන 300 ක මුදලක් හා 2018 වර්ෂයේදී රු. මිලියන 100 ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත යවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. අදාල විගණන විමසුමේ සඳහන් රු 165,284,562.00 ක අතිරික්තය මූල්‍ය අතිරික්තයක් නොවන බවද කාරුණිව දන්වා සිටිමි

**(ii) පනතේ 11වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය**

තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය මගින් ඉල්ලීම් කර ඇත. (අදාල ලිපියේ පිටපත විගණකාධිපතිගේ අංක ආර්ටී/බී/එන්ටීසී/එෆ්/2012/22 දරන විමසුමට පිළිතුරු සමග විගණනය වෙත ඉදිරිපත් කර ඇත.)
එසේ වුවත් 2012 අගෝස්තු මස 22 වන දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවේදී, කෙටි කාලීන අතිරික්ත අරමුදල් සත් දින කැඳවුම් තැන්පතු වල ආයෝජනය කරනවා වෙනුවට යම් කොටසක් වැඩි පොළී ආදායමක් ලැබීම සඳහා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන මෙන් උපදෙස් ලැබී ඇත. (රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභා රැස්වීම් සටහන් වල පිටපතක් අංක ආර්ටී/බී/එන්ටීසී/එෆ්/2012/22 දරන විමසුමට පිළිතුරු සමග විගණනය වෙත ඉදිරිපත් කර ඇත.)

එයට අමතරව තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය වෙත 2019.02.07 දිනැතිව ඉල්ලීමක් ඉදිරිපත් කර **ඇති අතර මේ දක්වා එයට පිළිතුරක් ලැබී නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි.**

**(ආ)** 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 08 වගන්තිය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා මූලික අවශ්‍යතා දෙකක් සම්පූර්ණ විය යුතු වේ. එනම්

01. අදාල මාර්ගයට මගී ඉල්ලුමක් පැවතිය යුතුය.
02. අදාළ පළාත් ප්‍රවාහන අධිකාරී දෙකෙන් ධාවන වේලාවන් ලබා දීම සහ පර්යන්ත පහසුකම් ලබා දීමට එකග වී නිර්දේශ ලබා දිය යුතුය.

ඒ අනුව 2018 වර්ෂයේ නව මාර්ග 70කට ඉල්ලීම් ලැබුණ අතර එම සියලූම මාර්ග සඳහා අදාල පළාත් ප්‍රවාහන අධිකාරී වලින් නිර්දේශ කැඳවන ලදී. නමුත් එක් මාර්ගයකට පමණක් අදාල ප්‍රවාහන අධිකාරී වලින් නිර්දේශ ලැබුණ අතර අනෙක් මාර්ග සඳහා පළාත් ප්‍රවාහන අධිකාරී ධාවන වේලාවන් හෝ පර්යන්ත පහසුකම් ලබා දීම සිදු කර නොමැත.

ඒ අනුව එම මාර්ග සමීක්ෂණය කිරීම සඳහා , දරණ මුදල් අනවශ්‍ය වියදමක් වන බැවින් මගී සමීක්ෂණ සිදු නොකරන ලදී.

කෙසේ වෙතත් නිර්දේශ ලැබී ඇති මාර්ගය සමීක්ෂණය කර, මගී ඉල්ලුමක් පැවතියහොත් ටෙන්ඩර් කිරීමට යොමු කරන අතර, මේ වන විට ටෙන්ඩර් ක්‍රමවේදය සංශෝධනය කරමින් පවතී.

- ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ අංක 09(I) යටතේ දක්වා ඇති පරිදි කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය යැයි හැඟී යන ඕනෑම කටයුත්තක් කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභා පණතේ පවතින විධි විධාන වලට අනුකූලව මෙය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුන වූයේ මගී ජනතාවට ගුණාත්මක බවින් හා විශ්වාසදායී මෙන්ම මනා පහසුවකින් යුතු ප්‍රවාහන සේවාවක් ලබා දීමයි.

එමෙන්ම බස් නැවතුම් ස්ථානවල පවතින මගී තදබදය හැකි තරම් අඩු කිරීම,මුදල් සංසරනය අවම කීරීම, මේ වන විට තෙවන පාර්ශව ලෙස පෞද්ගලික ආයතන කිහිපයක් මගින් අයථා ලෙස අධික සේවා ගාස්තු අය කරමින් පවත්වා ගෙන යන ආසන වෙන් කිරීමේ මධ්‍යස්ථාන(Booking Centers) හා මාර්ග ගත සේවා(Online Reservation) වැළැක්වීම  මෙම සේවාව ක්‍රියාත්මක කිරීමේ සෙසු අරමුණු ලෙස දැක්විය හැකිය.

- අදාල විගණන විමසුමේ සඳහන් පරිදි ව්‍යාපෘතිය අවසන් කර ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත භාර දීමට නියමිතව තිබුනේ 2018-නොවැම්බර් මස 15 වන දින වන විටදීය.

නමුදු මෙම ව්‍යාපෘතිය තුළින් ආයතනය තුළ ක්‍රීයත්මක වන ප්‍රධානතම ක්‍රියාවලීන්  සඳහා ස්වයංක්‍රීයකරණ පද්ධති නිර්මාණය කරන අතර එහිදී අදාල ආයතනය විසින් ටෙන්ඩරය ලබා ගැනීමේදී ව්‍යාපෘතිය අවසන් කිරීමට ගත වන කාලය ගණනය කර තිබුනේ මෙම ක්‍රියාවලීන් තුළ අන්තර්ගත විෂය පථය පිලිබඳ නිසි අවබෝධයකින් තොරව වන අතර පහත සඳහන් කරුණු ද ඊට අමතරව අදාල කාල පාරසය දීර්ඝ වීමට බලපා ඇත.

- ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම සත්‍යාපනය(BPR Verification) කිරීම සඳහා අදාල ආයතනය ඇස්තමේන්තුගත කාලය සති 03ක් වූ අතර ඒය ප්‍රායෝගිකව සිදු කිරීමට ගත වූ කාලය සති 08කි එනම් එම ආයතනයේ නිලධාරීන් හට එක් එක් දෙපාර්තුමේන්තුව තුළ පවතින එක් එක් ඒකක සඳහා වෙන වෙනමම අවශ්‍යතා හඳුනාගැනීමේ සැසි වාර පැවැත්වීමට සිදු වීම.
- අදියර 01 හි මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර සැකැසීම සහ එය සහතික කර ගැනීම(SRS Preparation and Sign off) සඳහා ඇස්තමේන්තුගත කාලය සති 03ක් වූ අතර ඒ සඳහා සත්‍ය ලෙස ගත වූ කාලය සති 09කි.එනම් අදාල කාල සීමාව තුළ එම දෙපාර්ත්මේන්තුවෙහි ප්‍රධාන නිලධාරීන් විශේෂ අවුරුදු සේවා රාජකාරී කටයුතු වල නියැලී සිටීම හේතුවෙන් එය ප්‍රමාද වී තිබුණි.

- ඉහත සඳහන් කරුණු වලට අමතරව මෙහිදී ප්‍රධාන වශයෙන් ප්‍රමාද වීමට හේතු සාධක වූයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජ්‍ය ආයතනය(ICTA) විසින් ලබා දීමට එකඟ වී තිබූ ක්ලවුඩ් සේවාව(LGC 2.0 ) නියමිත පරිදි ලබා දීමට නොහැකි වූ අතර එය ලබා දෙන ලද්දේ 2018-ඔක්තොම්බර් මස 01 දින දීය.

ඒ අනුව අදාල ආයතනය විසින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම ලබා දෙන ලද කාලය ඉක්මවීමට ඉහත සඳහන් හේතු බලපාන ලදි.

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අදියර 03ක් ඔස්සේ විකාශනය වන අතර මේ වන විට අදියර 01 සම්පූර්ණ ලෙස අවසන් කර ඇති අතර අදියර 02 හි එක් එක් පද්ධතීන්ට අදාලව පරිශීලක පිළිගැනීමේ පරීක්ෂාව(UAT-User Acceptance Testing) සිදු කරමින් පවතින අතර එය 2019-09 වන මස මැද වන විට සම්පූර්ණ කල හැකි වනු ඇත.එමෙන්ම අදියර 03 හි මෘදුකාංග අවශ්‍යතා පද්ධතීන් නිර්මාණය (Software Requirement Specification Design stage) කරමින් පවතී. ඒ නුව සමස්ථ ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය මේ වන විට 70% ඉක්මවා පවතින අතර මූල්‍ය ප්‍රගතිය 2018-දෙසැම්බර් 31 වන දින වන විට 35% ක් ලෙස පෙන්නුම් කරනුයේ ගිවිසුම් ප්‍රකාරව අත්තිකාරම් මුදලක් සහ ඔවුන් විසින් සිදු කරන ලද කාර්යයන් වලට අදාලව ඉදිරිපත් කරන ලද සැපැයුම් වලට (Deliverables Sets) අනුකූලව ගෙවීම් අවස්ථා 02 ට අදාලවය.

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2018 වර්ෂයේදී සිසුසැරිය සේවා සඳහා ඉල්ලීම් 31ක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලැබී තිබුණි. ඉන් එක් සේවාවකට බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිර්දේශය මත සංශෝධනයක් සහිතව සිසුසැරිය සේවාව ලබා දීමට මේ වන විට කටයුතු කර ඇත. අනෙකුත් ඉල්ලීම් ඉටු කිරීම සඳහා බස්රථ යෙදවීමට ධාවකයන් නිර්දේශ කර ලබා දෙන ලෙසට අදාළ පළාත් ප්‍රවාහන අධිකාරී වලට හා හෝ ශ්‍රී ලංගමයට දැනුම් දී ඇත. පළාත් ප්‍රවාහන අධිකාරී වලින් මෙම සේවාවන් සඳහා ධාවකයන් නිර්දේශ වී නැති අතර ශ්‍රී ලංගම ඩිපෝවන් හි පවතින රියදුරු, කොන්දොස්තර සේවක කණ්ඩායම්හි හිගය සහ පාසල් සේවා සඳහා නව බස්රථ නොමැති වීම යන කරුණු මත ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් යොමු කරන නව පාසල් සේවා ආරම්භ කිරීමේ ගැටළු සහගත

තත්වයක් පවතින බවට ශ්‍රී ලංගම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) , 2018.10.02 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත. ලිපියේ පිටපතක් අමුණා ඇත. මෙවැනි තත්වයක් මත ලැබී ඇති ඉල්ලීම් ඉටු කිරීමේ හැකියාව නොමැති වී ඇත. මෙම ඉල්ලීම් 31 පළාත තුල මාර්ග (අන්තර් පළාත් නොවන) සඳහා ඉල්ලා ඇති අතර එම මාර්ග වලට මගී සේවා අවසර පත්‍ර නිකුත් කර සිසුසැරිය සේවාවට අනුයුක්ත කර ගැනීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාවට නීත්‍යානුකූල බලයක් නැත. එහෙයින් එම ඉල්ලීම් සියල්ල ශ්‍රී ලංගමයට සහ අදාල පළාත් ප්‍රවාහන අධිකාරී වලට යොමු කර ඔවුන් විසින් එම සේවාවන් සඳහා බස් සැපයීමට නිර්දේශ කරන්නේ නම් පමණක් සිසුසැරිය සේවාවට අනුයුක්ත කර ගත හැක.

එහෙත් පළාත් ප්‍රවාහන අධිකාරී වෙත ලැබී ඇති ඉල්ලීම් වලට, එම අධිකාරී මගින් ලබා දී ඇති කිර්දේශ වලට අනුව සහ ශ්‍රී ලංගමයෙන් සෘජුව නිර්දේශ වී ඇති සේවා 57ක් සඳහා 2018 වර්ෂයේ ජාතික ගමනාගමන කොමිෂන් සභාව සිසුසැරිය සේවා ලබා දීමට කටයුතු කර ඇත.

**(ආ)** 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 24 වැනි වගන්තිය අනුව මගී අවසරපත්‍ර නිකුත් කිරිමට කොමිෂම වෙත ප්‍රතිපාදන පැවතියත් මගී සෙවා අවසර පත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය පිලිබඳව පනතේ සඳහන් නොවේ.ජා.ග.කො.ස. ස්ථාපිත කල අවධියේ සිට 2008 වෂීය දක්වා මගීසේවා අවසරපත්‍ර නිකුත් කර ඇත්තේ එක් එක් පුද්ගලයෙක් විසින් කරනු ලබන ඉල්ලීම පදනම් කරගෙනය. එහිදී විවෘත හා විනිවිදභාවයක් නොවිය.එම මගීසේවා අවසරපත්‍රවල අයු කාලය පිලිබඳ කිසිදු සඳහනක් නොවූ අතර රු.3000/= ක මුදලක් අයකර වාර්ෂිකව යාවත්කාලීන කර ඇත.
2005 වෂීයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අංක අමප/05/1461/031/036 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නිත්‍ය මගීසේවා අවසර පත්‍ර නිකුත් කිරීමෙදි ටෙන්ඩර් ක්‍රමවේදය අනුගමනය කිරීමට අනුමැතිය ලබා දි ඇති අතර, ඒ අනුව පනත සංශෝධනය කිරීම සිදුකරන ලෙසටද නිර්දේශ කර ඇත. මෙම ක්‍රමවේදය මගින් මුල්වරට ටෙන්ඩර් කැඳවා ඇත්තේ 2008 වෂීයේදීය.

ඒ අනුව ජා.ග.කො.ස. ස්ථාපිත කල අවධියේ සිට 2008 වෂීය දක්වා එනම් අවුරුදු 15 කට ආසන්න කාලයක් නිසි ක්‍රමවේදයකින් තොරව පනතේ වගන්ති වලට පටහැනිව මගීසේවා අවසර පත්‍ර නිකුත් කර ඇත. 2005 වෂීයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ටෙන්ඩර් ක්‍රමවේදයෙන් පවා පනතේ වගන්තිවලට පටහැනිව මගීසේවා අවසර පත්‍රයක කාලය පිලිවෙලින් වසර 5 කට හා තවත් වසර 3ක් ලෙස වසර 8ක කාලයක් සඳහා නිකුත් කර ඇත. මේ පිළිබඳව කරුණු අවබෝධ කරගැනීමෙන් පසු 2017 වර්ෂයේදී නිකුත් කල මගීසේවා අවසරපත්‍ර 21 ක් පනතේ 25 වන හා 30වන වගන්ති ප්‍රකාරව වසර 6ක කාලයක් සඳහා නිකුත් කර ඇත.

2018.12.31 දිනට ලබාදුන් දත්තවලට අනුව දැනට වලංගු මගිසේවා අවසර පත්‍රසඛ්‍යාව 3152ක් වන අතර ඉන් ටෙන්ඩර් ක්‍රමවේදයට නිකුත් කර වලංගුව පවතින මගීසේවා අවසර පත්‍ර ප්‍රමාණය 288ක් වේ. ඒ අනුව වලංගුව පවතින ඉතිරි මගීසේවා අවසර පත්‍ර 2864 ම ටෙන්ඩර් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට

පෙර නිකුත් කල මගී සේවා අවසරපත්‍ර වන අතර එම මගී සෙවා අවසර පත්‍රවල කාලය පිලිබඳ කිසිදු සඳහනක් නොමැත.

එබැවින් එම මගීසේවා අවසරපත්‍ර 2864 අවලංගු කර නැවත ටෙන්ඩර් කැඳවීමේදි මගීසේවා අවසරපත්‍ර හිමියන්ගෙන් විරෝධතාවයක් එල්ල විය හැක.විගණන විමසුමෙහි සඳහන් මගීසේවා අවසර පත්‍ර සංඛ්‍යාවේ රු 3000/= බැගින් ගෙවනු ලබන අවසරපත්‍ර ප්‍රමාණයන්හි ටෙන්ඩර් බලපත්‍රද අඩංගු වි ඇත.

දැනට පවතින මගීසේවා අවසරපත්‍රයක් යම් සංශෝධනයකට ලක්වන අවස්ථාවකදී (මාර්ග සංශෝධනය හා ඥාතීත්වයමත අයිතිය සංශොධනය) එම මගීසෙවා අවසරපත්‍රවල වාෂීක යාවත්කාලීන කිරීමේ ගාස්තුව රු 3000/= සිට රු 15000/= ක් දක්වා වැඩි කරනු ලැබේ.

ඒ අනුව දැනට වලංගුව පවතින මගීසේවා අවසරපත්‍ර 288ක් ටෙන්ඩර් ගාස්තුව හා රු 3000/= ක් අයකිරීමෙන්ද, බලපත්‍ර 940 ක් රු 15000/=ක් අයකිරීමෙන්ද වාෂීකව යාවත්කාලීන කරනු ලබයි.ඉතිරි මගීසේවා අවසරපත්‍ර සඳහා අයකරනු ලබන රු 3000/=ක මුදල වැඩි කිරීම පිලිබඳ දැනට විගණන හා කලමනාකරන කමිටුවේ සාකච්ඡා වී ඇති අතර මේ පිලිබඳ ඉදිරියේදී අන්තර් පළාත් බස් රථ හිමියන් සමඟද සාකච්ඡා කිරීමට සැලසුම් කර ඇත.

2014 වර්ෂයේදී මාර්ග සංශෝධන මඟින් අධිවේගී මාර්ගයට නිකුත් කරන ලද මගීසේවා අවසර පත්‍ර 56ක් 2015 වර්ෂයේ දී අවලංගු කර එම ධාවකයින්ගේ පැරණි මාර්ගයට අනුයුක්ත කර ඇත. මෙම බස් රථ අධිවේගී මාර්ගයේ ධාවනය වූ කාලයේ දී මගීන් එම සේවාව සඳහා පුරුදුව සිටි බැවින් මගී ඉල්ලුම සපුරා ලීමටත් අඛණ්ඩව එම සේවාව පවත්වාගෙන යාමටත් තාවකාලික අවසර පත්‍ර නිකුත් කර ඇත.

තවද තාවකාලික මඟී සේවා අවසර පත්‍ර නිකුත් කරනු ලබන මාර්ග සඳහා නිත්‍ය මඟී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට අවස්ථා 03 කදී ප්‍රසිද්ධ දැන්වීම් මඟින් ටෙන්ඩර් කැඳවීමට කටයුතු කලද එයට එරෙහිව ධාවකයන් විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.එහෙත් අංක 25 යටතේ කැඳවන ලද ටෙන්ඩරය මඟින් නිත්‍ය මඟී සේවා අවසර පත්‍ර 21 ක් නිකුත් කිරීමට හැකිව ඇත.

**(ඇ)** ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මගී ඉල්ලුමක් ඇති අවස්ථාවල මෙන්ම කාල සටහන් පුරප්පාඩු පවතින අවස්ථාවල තාවකාලික අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ අනුව අධිවේගී මාර්ගයේ ධාවනය වන බස්රථයක් සිය කාල සටහනේ ඇති ගමන්වාරය ධාවනය සිදු නොකරනු ලබන අවස්ථාවන්හිදි ඒ වෙනුවෙන් එම අධිවේගී මාර්ගයේ හෝ වෙනත් මාර්ගයක ධාවනයට බලපත්‍ර නිකුත් කර ඇති බස්රථයක් එම පුරප්පාඩු ගමන්වාරය වෙනුවෙන් ධාවනයට යොදවනු ලැබේ. එවැනි අවස්ථාවකදි අමතර යොදවනු ලබන බස්රථ සිය ගමන්වාරයෙන් පසුව අමතරව ගමන්වාරයක් ධාවනය කරනු ලබන්නේ නම් ඒ සඳහා අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

ඒ අනුව දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් හා අධිවේගී බස්රථ සේවා ආරම්භ වන කඩවත, කඩුවෙල හා මහරගම බස් නැවතුම්පලයන්හි රාජකාරි කරන වේලා සටහන්කරුවන් විසින් අධිවේගී මාර්ගයේ ධාවනය සඳහා නිකුත් කර ඇති තාවකාලික අවසරපත්‍ර නිකුත් කරනු ලබන්නේ එම මාර්ගයේ බස්රථ කාල සටහනේ අවශ්‍යතාවය මත ධාවනය කරන අමතරවාර සඳහා මෙන්ම වැඩි මගී ඉල්ලුමක් පවතින අවස්ථාවන්හිදි වේ.

එසේම සති අන්තයේ හා දීර්ඝ නිවාඩු ඇති අවස්ථාවන් වලදී වැඩි මගී ඉල්ලුමක් පවතින අතර, එම මගී ඉල්ලුමට ප්‍රමාණවත් බස්රථ සැපයිම සඳහා තාවකාලික අවසරපත්‍ර මඟින් බස්රථ යෙදවීම කරනු ලැබේ. එසේ නිකුත් කිරිම කරනු ලබනුයේ මගීන්ට කඩිනමින් තම ගමනාන්තය වෙත යෑම සඳහා අවශ්‍ය බස්රථ සැපයුම වෙනුවෙන්ය. නිත්‍ය මගීසේවා අවසරපත්‍ර හිමි බස්රථවලට පමණක් තාවකාලික අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ.

එම නිත්‍ය මගීසේවා අවසරපත්‍රය ලබාගත් අවස්ථාවන්හිදි ජාතික ගමනාගමන කොමිෂන් සභාවට හෝ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත රජයේ නියමිත ගාස්තු දැනටමත්ගෙවා ඇති බස්රථයන් වේ.

**(ඇ)** ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත 2018 වර්ෂය තුල නිකුත් කර ඇතිසියළුම තාවකාලික අවසරපත්‍ර පොත්හි පිටපත සහිත අදායම ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත භාරදී ඇත.

එමෙන්ම දකුණු පළාත් ප්‍රවාහන අධිකාරිය මඟින් එම අධිකාරියට අයත් දිස්ත්‍රික් කාර්යාලය වෙත නිකුත් කරන ලද පොත් හා ආදායම් විස්තර එම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර නැවත ජාතික ගමනාගමන කොමිෂන් සභාවට යොමු කරන බැවින් එ සඳහා කිසියම් කාල සීමාවක් ගතවනු ඇත.

**(ඉ)** 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක හා ළගා කර ගැනීමට හැකි වූ ඉලක්ක පිළිබදව සවිස්තර වාර්තාව පහත පරිදි වේ.

| ව්‍යාපෘතිය | 2018 වර්ෂයේ ආරම්භ කිරීමට ඉලක්ක කළ සේවා සංඛ්‍යාව | අලුතින් ආරම්භ කිරීමට හැකි වූ සේවා සංඛ්‍යාව | වැඩි කර ගැනීමට නොහැකි වූ ඉලක්ක | ළඟා කර නොගත් ඉලක්කය ප්‍රතිශතයක් ලෙස | ළඟා කර ගත් ඉලක්කය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| සිසුසැරිය | 100 | 57 | 43 | 43% | 57% |
| ගැමි සැරිය | 15 | 04 | 11 | 73% | 27% |
| නිසි සැරිය | 100 | 50 | 50 | 50% | 50% |

සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි වීමට , අදාළ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි වලින් සේවා සැපයීම සඳහා ධාවකයින් ඉදිරිපත් නොකිරීම හා ශ්‍රීලංගම ඩිපෝ වල පවතින සේවක හිගය, බස්රථ හිගය නිසා බස්රථ යෙදවීමට නොහැකි වීම යනාදිය හේතු විය.

ගැමි සැරිය ව්‍යාපෘතිය යටතේ

| පළාත | වයඹ | මධ්‍යම | නැගෙනහිර | මුළු සේවා ගණන |
|---|---|---|---|---|
| සමීක්ෂණය කරන ලද මාර්ග සංඛ්‍යාව | 05 | 01 | 13 | 19 |
| ටෙන්ඩර් කරන ලද මාර්ග සංඛ්‍යාව | 05 | 01 | 13 | 19 |

වයඹ පළාතේ සේවා 05ක් , මධ්‍යම පළාතේ සේවා 01ක් සහ නැගෙනහිර පළාතේ සේවා 13ක් සමීක්ෂණ කටයුතු සිදු කළ අතර ඉන් වයඹ පළාතේ සේවා0 2ක් සඳහා 2018 වර්ෂයේදී ගිවිසුම් ගත විය. 2019 වර්ෂයේදී තවත් සේවා 02 කට ගිවිසුම් ගත වී ඇත. එක් සේවාවකට ටෙනඩර්කරු ඉදිරිපත් වී නැත.

එමෙන්ම මධ්‍යම පළාතේ සේවාව සඳහා ද ටෙන්ඩරකරු ඉදිරිපත් වී නැත.

2018 සැප්තැම්බර් මාසයේ සිට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම හේතුකොටගෙන නැගෙනහිර පළාතේ සේවා 13 ටෙන්ඩර් කිරීමේ කටයුතු ප්‍රමාද විය. මේ වන විට නැගෙහිර පළාතේ සේවා 13 ටෙන්ඩර් කිරීමෙන් අනතුරුව අඩුම ලන්සු ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුවන් 13 දෙනෙක් තෝරාගෙන ගිවිසුම්ගත වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යය සිදු වෙමින් පවතී. ඒ අනුව 2018 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවතියානම් අදාල ඉලක්කය දක්වා (15) සේවාවන් ආරම්භ කිරීමේ හැකියාව පැවතින.

නිසි සැරිය ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක 100න් 50ක් ළඟා කර ගැනීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම සත්‍ය වශයෙන්ම ධාවනය වන බවට ජංගම පරීක්ෂණ අංශයේ පරීක්ෂාණ වලින් තහවුරු කර ගත් සේවා ආරම්භ කිරීමට ගිවිසුම්ගත වීම සඳහා ඩිපෝ කළමණාකරුවන් සහ ඩිපෝ ධාවන කළමණාකාර වරුන් නියමිත දින වලට කොමිෂම වෙත නොපැමිණීමද අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි වීමට හේතු වීඇත.

(ඊ) මෙම කරුණට අදාලව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් බැස්ටියන් මාවත පොදු වැසිකිළි පද්ධතිය නඩත්තු කිරීම සඳහා වූ ගිවිසුම්ගත ආයතනයේ (මේධා එන්ටර්ප්‍රයිසස්) හිමිකරු ආයතනයට කැඳවා අවවාද කර ඇති ඇති අතර 2019 මාර්තු මස මා විසින්ද ගිවිසුමට අනුව කටයුතු කිරීමට වග බලා ගන්නා ලෙසට වාචිකව මෙන්ම ලිඛිතවද අවස්ථා කිහිපයකදීම දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරියේදී අදාල ගෙවීම් නිසියාකරව කිරීමට මේධා එන්ටර්ප්‍රයිසස් ආයතනයේ හිමිකරු එකග වී ඇත.

(උ) ජංගම පරික්ෂණ අංශයේ නිලධාරින් බලපත්‍ර නොමැතිව ධාවනය කර ඇති බවට හඳුනා ගන්නා ලද බස්රථ සේවාවන් හා කාල සටහන් පුරප්පාඩු ඇතුලත්ව මාර්ග 06ක බලපත්‍ර 09ක් නිකුත් කිරිම සඳහා ටෙන්ඩර් අංක 27 යටතේ නිත්‍ය බලපත්‍ර නිකුත් කිරිමට කටයුතු යොදවා තිබුණි. ඒ අනුව එම ටෙන්ඩරය විවෘත කර තෝරා ගත් ධාවකයින්ට නව නිත්‍ය මගීසේවා අවසරපත්‍ර නිකුත් කිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර එය අනුමත කරන ලදි. එහෙත් එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය තහවුරු නොවීම නිසා නව අධ්‍යක්ෂ මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කිරිමට කටයුතු කරනලද අතරඅධ්‍යක්ෂ මණ්ඩලයේදී එම ටෙන්ඩරය අවලංගු කරන ලෙස උපදෙස් ලබා දී ඇත

ජනක මල්ලිමාරච්චි

සභාපති

ජාතික ගමනාගමන කොමිෂන් සභාව